දිස්ත්‍රික් ලේකම්/දිසාපති,
වවුනියාව පරිපාලන දිස්ත්‍රික්කය.

2015 ජූලි මස 06 වැනි දින,
වවුනියාව දිසාපති කාර්යාලයේ දී ය

07-1160

## බොල්තුඹේ සමන් දේවාලයේ ඇසළ පෙරහැර - 2015

2015 වසරේ ඇසළ පෙරහැර සඳහා කප් සිටුවීම ජුනි මස 17 වැනි දින උදෑසන 6.04 ට යෙදුන සුභ මොහොතින් සිදුකරන ලදී.

* ජූලි මස 17 වැනි දින සිට 27 වැනි දින දක්වා උඩ මළුවේ පෙරහැර ද,
* ජූලි මස 27 වැනි දින සිට 31 වැනි දින දක්වා මහ පෙරහැරද,
* අගෝස්තු මස 01 වැනි දින වලහුන් ඇල්ල මූකලාන දිය උල්පතේ දී දිය කැපීමේ මංගල්‍යයෙන් අනතුරුව පෙරහැර ගෙවදීමෙන් ඇසළ පෙරහැර මංගල්‍ය නිමා කිරීමට නියමිත ය.

2. දේවාලයේ උතුරට පාර එම්. කේ. ලූවිස් සිංඤෝ, එම්. කේ. පොඩිමහත්තයා යන අයගේ ඉඩම්ද, නැගෙනහිරට සිරිනිමල් හා එම්. කේ. විජේදස යන අයගේ ඉඩම් ද, දකුණට රංබණ්ඩාර මහතා ගේ ගල්පඩි වත්ත යන ඉඩම ද, බස්නාහිරට බී. එම්. විජේහාමි හා නොබට් චින්තාමණී යන අයගේ ඉඩම් ද, මායිම්ව පිහිටි භූමි භාගය වන්දනා කරුවන්ට ලැගුම් සඳහාද පෙරහැර නැරඹීම සඳහා ද වෙන් කරමි.

3. විහාර මළුව, බෝධි මළුව හා දේවාල භූමිය යන ස්ථාන අවට භූමි භාගවල අහාර පිසීම තහනම් කරමි.

4. උඩ මළුව තුළ දඩු හැල තුළ චෛත්‍ය මළුව තුළ රථගේ මළුව හා විහාර මළුව තුළ සියලු වෙළඳාම් තහනම් කරමි.

5. පහල වීදියේ දකුණු පැත්තට ප්‍රධාන ගල්පඩි පෙළ සිට සිංහාසන මණ්ඩිරය දක්වා ගල්පඩි පෙළ, නැගෙනහිර පැත්තෙන් නැටුම් කාමරය දක්වා පහල වීදියේ දේවාලය දෙසට වන්නට රථගේ මළුව බැම්ම සිට චෛත්‍ය කොටස දක්වා ද මා විසින් නියම කරන ලද භූමිය ද නැවත රථගෙයි මළුවට නැගෙනහරින් හා දකුණින් පහල කොටසද රථගෙයි ඉදිරිපසින් දේවාලයට නැනෙහිර සීමාවට ආසන්නව වෙළඳාම් සඳහා පෙරහැර ගමන් කිරීම සඳහා අවහිර නොවන පරිදි අවසර දෙමි.

6. ඉහත 4 හා 5 වලින් නියම කර ඇති පරිදි හැර කඳවුරු භූමිය ඇතුලත අන් කිසිම ස්ථානයක වෙළඳාම් කිරීම සම්පූර්ණයෙන් තහනම් කරමි.

7. ප්‍රධාන මාර්ගයේ පුද්ගලික වාහන නතර කිරීම සම්පූර්ණයෙන් තහනම් කරමි. බයිසිකල් හා කරත්ත ඇතුළුව සියලුම රථ වාහන මාර්ග හෝ කඳවුරු භාර නිලධාරී තැනගේ බලපත්‍රයක් නොමැතිව කඳවුරු භූමිය තුළට ඇතුලු කිරීම තහනම් ය.

8. මා විසින් කඳවුරු භූමිය තුළ වෙළඳාම් කිරීම සඳහා වෙන් කරනු ලබන බිම් කොටස් බදු දෙන ආකාරය දැන්වීම් මඟින් ප්‍රසිද්ධ කරනු ලැබේ.

9. බද්ධට ගන්නා ලද වෙළඳ බිම්වල ඉදිකරණු ලබන තාවකාලික ගොඩනැගිලි සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ උපදෙස්වලට අනුකූල විය යුතුය. බිම් කොටස් බදු ගන්නා වෙළෙන්දන් විසින් ඇසළ උත්සවයෙන් පසු කඳවුරු භූමිය තුළ පොලිතීන් ඇතුළු සියලු අපද්‍රව්‍ය එකතු කර මහජන සෞඛ්‍ය පරීක්ෂක මහත්වරුන්ගේ උපදෙස් පරිදි ඉවත් කළ යුතුය.

10. මා ගෙන් ලබා ගත් අවසරයක් නොමැතිව කඳවුරු ප්‍රදේශයේ කිසිදු ගොඩනැගිල්ලක් ඉදිකිරීම තහනම් ය.

11. රතිඤ්ඤා වෙඩි ආදිය ප්‍රදේශය තුළ පත්තු කිරීම තහනම් ය.

12. ප්‍රාදේශීය ලේකම්ගේ බලයලත් නිලධාරියෙකුගේ අනුමැතියක් නොමැතිව කිසියම් තැනැත්තෙකු විසින් කඳවුරු ප්‍රදේශය තුළ ටිකට්පත්, කොඩි විකිණීම හෝ වෙනත් අන්දමක කුමන කාර්යයක් සඳහා හෝ මුදල් එකතු කිරීම නොකල යුතුය.

ජේ. එල්. සී. කේ. ජයසිංහ,
ප්‍රාදේශීය ලේකම්,
ඉඹුල්පේ.

07-1214

---

**කඹුරුපිටිය සපුගොඩ වාර්ෂික ඇසළ මහා පෙරහැර - 2015**

දකුණු පළාතේ මාතර දිස්ත්‍රික්කයේ කඹුරුපිටිය සපුගොඩ ඉලංගම්ගොඩ පුරාණ රජ මහා විහාරස්ථානයේ (සපුගොඩ විද්‍යානිකේත පිරිවෙණ) 2015 වාර්ෂික ඇසළ මහා පෙරහැර 2015 ජූලි 21 වැනි දින සිට ජූලි 31 දින තෙක් පවත්වනු ලබන බව වන්දනා ගමන් ආඥා පනත (175 පරිච්ඡේදය) යටතේ 1984 ජුනි මස 27 වැනි දින නිකුත් කරන ලද අංක 308 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද රෙගුලාසි අනුව මෙයින් දන්වමි.

එන්. එච්. එම්. ඩබ්. ඩබ්. එන්. හේරත්,
ප්‍රාදේශීය ලේකම්,
කඹුරුපිටිය.

2015 ජුනි මස 03 වැනි දින,
කඹුරුපිටිය ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ දී ය.

07-1215

---

# ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා

## ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

2013.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා

**මූල්‍ය වාර්තාවල අදාළ සටහන්**

**වැදගත් ගිණුම් ප්‍රතිපත්ති :**

1. *පොදු* .- විශ්ව විද්‍යාලයේ මූල්‍ය වාර්තා පොදුවේ පිළිගත් ගිණුම්කරන ප්‍රමිතීන්ට හා ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව ඓතිහාසික පිරිවැය පදනම් කරගෙන සකස් කර ඇත. වත්කම් අත්පත් කර ගන්නා දිනට පවත්නා වටිනාකම අනුව, වගකීම දැරූ හා අරමුදල් ලැබූ දිනට පවත්නා වටිනාකම සාමාන්‍ය පිළිගත් ගිණුම්කරණ ප්‍රතිපත්තීන්වලට අනුකූලව පෙර වර්ෂයන්හි භාවිතා කළ ක්‍රමවලට අනුකූලව ගණුදෙනු සටහන් කර ඇත.

1.1 *සංසන්දනාත්මක තොරතුරු* .- පවත්නා වර්ෂයේ ශේෂයන් වර්ගීකරණය හා ඉදිරිපත් කිරීම සංසන්දනාත්මක ලෙස තහවුරු කිරීම සඳහා පෙර වර්ෂයට අදාල ශේෂයන් නැවත වර්ගීකරණය කර ඉදිරිපත් කර ඇත.

2. *වත්කම් හා එහි වටිනාකම් ගණනය කිරීමේ පදනම*

2.1 *දේපළ, පිරියත, උපකරණ හා ක්ෂය* .- දේපළ, පිරියත හා උපකරණ පිරිවැයෙන් සමුච්චිත ක්ෂය අඩුකර ශුද්ධ අගයට පෙන්වා ඇත. සියලුම වත්කම් මිලදී ගත් පිරිවැය සහ අනෙකුත් වියදම් වටිනාකමට සටහන් කර ඇත. පරිත්‍යාග වශයෙන් ලැබෙන වත්කම්හි වටිනාකම් එහි පිරිවැය මත ගණනය කර ඇත.

ශ්‍රී.ල.රා.අ.ගි.ප්‍ර 7ට අනුව පරිත්‍යාග ලෙස ලද දේපළ පිරියත හා උපකරණවල වටිනාකම ප්‍රාග්ධනය කර හා එහි ඵලදායි ආයු කාලය මත ක්‍රමක්ෂය කර ඇත.

වත්කම්වල ඵලදායි ජීවකාලය තුළ පිරිවැය කපා හැරෙන පරිදි පහත සඳහන් රේටයන්ට අනුව වාර්ෂිකව සරල මාර්ග ක්‍රමයට වත්කම් ක්ෂය කරනු ලැබේ.

| | |
|---|---|
| ඉඩම් | - |
| ගොඩනැගිලි - සවිකිරීම් ඇතුළුව | 5% |
| ලීබඩු සහ සවිකිරීම් | 10% |
| කාර්යාල උපකරණ | 20% |
| පොත් හා වාර සඟරා | 20% |
| මෝටර් රථ | 20% |
| විද්‍යාගාර හා ඉගැන්වීමේ උපකරණ | 20% |
| උපාධි ලෝගු | 20% |
| ක්‍රීඩා භාණ්ඩ | 20% |
| අනෙකුත් ස්ථාවර වත්කම් (ජල සැපයුම්, විදුලි හා දුරකථන) | 10% |

2.1(ඒ) විශ්ව විද්‍යාලය විසින් ඉපයීම් අරමුදල් හා වෙනත් ව්‍යාපෘති අරමුදල් වලින් මිළදී ගත් දේපළ පිරියත හා උපකරණයන් හි වටිනාකම "උපයාගත් අරමුදල් තුළින් ප්‍රාග්ධන වියදම් සඳහා දායකත්වය" යටතේ පෙන්වා ඇත.

2.1(බී) 2012 වර්ෂයේ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් රු. 5,900,000.00 වටිනා මිට්සුබිෂි මොන්ටෙරෝ වර්ගයේ වාහනයක් පරිත්‍යාග ලෙස ලැබිණි.

2.1:(සී) වර්ෂය තුළ රු. 15,405,608.66 ක් වටිනා වත්කම් විශ්ව විද්‍යාලයට 21 වන ශත වර්ෂ උසස් අධ්‍යාපන ව්‍යාපෘතිය මගින් ලැබිණ. විස්තර පහත පරිදි වේ. නමුත් මෙම වත්කම්හි අයිතිය විශ්ව විද්‍යාලය වෙත ලැබී නොමැති බැවින්, අදාළ වටිනාකම වත්කම් හි ඇතුළත්ව නොමැත.

| | | |
|---|---|---|
| QIG අරමුදල් | විද්‍යාගාර හා ඉගැන්වීමේ උපකරණ | 2,565,034.66 |
| | කාර්යාලීය උපකරණ | 1,103,000.00 |
| UDG අරමුදල් | පොත් හා වාර සඟරා | 97,779.00 |
| | ලී බඩු හා සවි කිරීම් | 2,277.890.00 |
| | කාර්යාලීය උපකරණ | 85,750.00 |
| | විද්‍යාගාර හා ඉගැන්වීමේ උපකරණ | 9,276,155.00 |
| | එකතුව | 15,405,608.00 |

2.2 *තොගය .-* ගබඩා තොග වටිනාකම ගණනය කිරීම සඳහා පළමුවෙන් ලැබීම්, පළමුවෙන් නිකුත් කිරීමේ ක්‍රමය අනුගමනය කරනු ලැබේ. ගබඩා තොග භෞතික වශයෙන් ගණනය කර ශේෂ පත්‍ර දිනට වටිනාකම ගණනය කරනු ලැබේ.

2.3 *සේවකයන්ට ගෙවනු ලබන ණය සහ අත්තිකාරම් .-* සත්‍ය වශයෙන්ම සේවකයන්ගෙන් අයකර ගැනීමට නියමිත ණය මුදල ලැබිය යුතු මුදල ලෙස ගණනය කර ඇත.

3. *පාරිතෝෂිත සඳහා වෙන් කිරීම .-* පාරිතෝෂිත සඳහා වෙන් කිරීම 1983 අංක 12 දරන, පාරිතෝෂිත පනතට අනුව ගණනය කර ඇත. මෙම වෙන් කිරීම සඳහා බාහිර වශයෙන් අරමුදල් පිහිටුවා නැත.

4. *උපචිත හා වගකීම් සඳහා වෙන් කිරීම .-* ඇස්තමේන්තු හා ලැබී ඇති ලිපිලේඛනවල තොරතුරු මත උපචිත හා වගකීම් සඳහා වෙන් කිරීම් කරනු ලැබේ.

5. *ලැබිය යුතු දෑ .-* ගිවිසුම් හා බැඳුම්කර කඩ කළ කාර්ය මණ්ඩලයෙන් 2013.12.31 දිනට රු. 96,325,693.84 ක මුදලක් අයකර ගැනීමට ඇත. 2011 ජනවාරි මස 1 වැනි දින සිට ගිවිසුම් හා බැඳුම්කර කඩ කළ කාර්ය මණ්ඩලයෙන් අයවිය යුතු මුදල් උපචිත පදනමේ සිට මුදල් පදනමට ගිණුම් ගත කිරීමට ගිණුම්කරණ ප්‍රතිපත්තිය වෙනස් කර ඇත. එම නිසා සටහන් අංක 05.01 මගින් රු. 68,253,385.42 මුදලක් පෙන්වනු ලබන්නේ 2010 දෙසැම්බර් 31 දක්වා කාල පරිච්ඡේදයට අදාළ ලැබිය යුතු මුදල වේ.

6. *ආධාර සඳහා ගිණුම්කරණය .-* පුනරාවර්තන ආධාර, මුදල් පදනම මත ආදායම් වියදම් වාර්තාවේ හඳුනා ගෙන ඇත. ස්ථාවර වත්කම් පුනරුත්ථාපන පිරිවැය හා ප්‍රාග්ධන ආධාර සඳහා ඉදිකිරීම් සහ නව ව්‍යාපෘති, කෙරීගෙන යන වැඩ හෝ ස්ථාවර වත්කම් ලෙස අවශ්‍ය පරිදි හඳුනාගෙන ඇත.

7. *ආදායම හඳුනා ගැනීම -*

7.1 පුනරාවර්තන විදයම් සඳහා රජයේ ආධාර, ශිෂ්‍යාධාර හා මහපොළ මුදල් පදනම මත හඳුනාගැනේ.

7.2 මූල්‍ය පාඨමාලාවන්හි ඉපයීම් මුදල් පදනම මත අදාළ පාඨමාලා පවත්නා කාලය, වියදමට ගැලපෙන ලෙස හඳුනාගෙන ඇත.

8. *පෙර වර්ෂ ගැලපීම්* .- විශේෂ අරමුදලක් වූ (IRQUE) (IDA ණය 3781 CE) හි පෙර වර්ෂවල ක්ෂය හා ක්‍රමක්ෂය ගණනය කිරීම්වල නිවැරදි කිරීම් ප්‍රවර්තන වර්ෂයේ දී ගැලපීම් කර ඇත. මෙම නිවැරදි කිරීම් සඳහා, සංසන්දනාත්මක අගයන් සමග ඉදිරිපත් කර ඇත. (උපලේඛන E)

9. *ප්‍රාග්ධන වියදම සඳහා රජයේ ප්‍රදාන ගිණුම්කරණය* .- ශ්‍රී.ල.ගි.ප්‍ර. අංක 20ට අනුව ප්‍රාග්ධන වියදම සඳහා, රජයේ ප්‍රදාන අවසාන ගිණුම්වල දක්වා ඇත. ගිණුම්කරණ ප්‍රමිතයන්ට අනුව රජයේ ප්‍රදාන විලම්භිත ආදායම ලෙස අවසාන ගිණුම්වල හඳුනාගෙන ඇති අතර, වත්කමේ ජීවන කාලය අනුව ක්‍රම ක්ෂය කර ඇත.

මූල්‍ය ප්‍රකාශන 2013

**දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය**

| | *2013 දෙසැ. 31 දිනට* | *2012 දෙසැ. 31 දිනට ගැලපූ* |
|---|---|---|
| | *රු.* | *රු.* |
| (ඉලක්කම් ආසන්න රුපියලට ගලපා ඇත) | | |
| **වත්කම්** | | |
| **ජංගම නොවන වත්කම්** | | |
| දේපළ පිරියත හා උපකරණ | 1,34,44,91,268 | 1,118,566,835 |
| කෙරීගෙන යන වැඩ | 13,44,95,102 | 12,44,421,560 |
| ආයෝජන | 42,54,65,093 | 26,07,27,751 |
| | 1,90,44,51,463 | 1,50,37,16,146 |
| **ජංගම වත්කම්** | | |
| ගබඩා තොගය | 4,71,91,045 | 4,87,24,952 |
| විවිධ ණයගැතියෝ සහ ලැබිය යුතු දෑ | 13,39,41,434 | 11,68,53,172 |
| සේවක ණය අත්තිකාරම් | 8,57,13,919 | 8,14,80,747 |
| අත්තිකාරම් හා පෙර ගෙවීම් | 10,51,59,524 | 9,04,46,161 |
| මුදල් හා මුදල් සමානයන් | 1,92,99,710 | 2,07,72,250 |
| **උප එකතුව** | **39,13,05,632** | **35,82,77,282** |
| **වත්කම් එකතුව** | **2,29,57,57,095** | **1,86,19,93,428** |
| **ස්කන්ධය හා වගකීම්** | | |
| **ස්කන්ධ ප්‍රාග්ධනය** | | |
| මූලධන ආධාර - වැයවූ | 1,31,07,17,599 | 1,09,58,87,239 |
| මූලධන ආධාර - වැයනොවූ | 20,76,843 | 7,25,679 |
| වෙනත් මූලධන ආධාර - විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව | 47,43,765 | 75,84,061 |
| මූලධන ආධාර - වාහන (අය වැය චක්‍රලේඛ - 150) | 1,08,70,000 | 1,45,55,000 |
| විශේෂ ව්‍යාපෘති IRQUE (IDA Credit - 3781 CE) | 1,66,39,613 | 2,41,84,755 |
| උපයාගත් අරමුදල් තුලින් ප්‍රාග්ධන වියදම් සඳහා දායකත්වය | 1,41,49,665 | 1,77,34,966 |
| ත්‍යාග හා පරිත්‍යාග | 5,10,58,921 | 4,13,19,880 |
| රඳවා ගත් ඉපයීම් | 10,95,44,186 | 8,90,36,853 |
| | 1,51,98,00,593 | 1,29,10,28,433 |
| **සංචිත හා අරමුදල්** | | |
| විශේෂ සංචිත | 5,13,60,863 | 3,75,05,456 |
| මූලධන සංචිතය | 2,55,74,237 | 2.56,71,311 |
| අනුස්මරණ අරමුදල් | 2,63,27,642 | 1,77,99,656 |

| | *2013 දෙසැ. 31 දිනට* | *2012 දෙසැ. 31 දිනට ගැලපූ* |
|---|---|---|
| | *රු.* | *රු.* |
| විවිධ ව්‍යාපෘති සහ පර්යේෂණ ආධාර | 3,97,59,748 | 3,45,66,276 |
| විලම්භීත ආදායම - ස්වයං මූල්‍ය හා ව්‍යාපෘති | 10,00,26,780 | 1,38,78,524 |
| | 24,30,49,270 | 12,94,21,223 |
| **ජංගම නොවන වගකීම** | | |
| විශ්‍රාම පාරිතෝෂික සඳහා වෙන් කිරීම් | 32,24,30,040 | 29,39,72,676 |
| | 32,24,30,040 | 29,39,72,676 |
| **ජංගම වගකීම්** | | |
| ආපසු ගෙවිය යුතු තැන්පත් | 69,87,268 | 2,69,35,572 |
| උපචිත වියදම් | 12,25,51,337 | 8,50,80,483 |
| ගෙවිය යුතු දෑ | 8,09,38,588 | 3,55,55,042 |
| | **21,04,77,193** | **14,75,71,097** |
| **ස්කන්ධය හා වගකීම්වල එකතුව** | **2,29,57,57,095** | **1,86,19,93,428** |

ආචාර්ය එන්. එල්. ඒ. කරුණාරත්න,
උපකුලපති

කේ. ජී. බ්‍රිටෝ,
ලේඛකාධිකාරි.

ඒ. අයි. එන්. පැස්කුවල්,
මූල්‍යාධිකාරි.

2014 ඔක්තෝබර් මස 17 වැනි දින.

**2012.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය**

(ඉලක්කම් ආසන්න රුපියලට ගළපා ඇත)

| | *2013* | *2012 ගැලපූ* |
|---|---|---|
| | *රු.* | *රු.* |
| **මෙහෙයුම් ආදායම** | | |
| රජයේ ආධාර - පුනරාවර්තන | 1,54,18,46,000 | 1,29,78,68,000 |
| රජයේ ආධාර - මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම් | 9,39,51,402 | 73,00,000 |
| ශ්‍රී.ල.වි. වි. ක්‍රීඩා තරඟාවලිය සඳහා වි. ප්‍ර. කො. අතිරේක ප්‍රතිපාදන | - | - |
| ආරක්ෂක සේවා සඳහා වි. ප්‍ර. කො. අතිරේක ප්‍රතිපාදන | - | 40,00,000 |
| ශිෂ්‍යාධාර | 3,93,75,200 | 2,19,45,600 |
| මෝටර් වාහන විකුණුම් මත ලාභය | 20,07,530 | - |
| මහපොළ ශිෂ්‍යත්ව | 10,59,86,000 | 13,24,38,150 |
| අභ්‍යන්තර ආදායම් | 32,34,43,189 | 21,04,90,445 |
| රජයේ ආධාර සහ පරිත්‍යාග ක්‍රමක්ෂය | 17,31,16,320 | 98,87,675 |
| හිඟ අර්ථසාධක දායකත්වය - ජීවන වියදම් දීමනාව මත/වි. ප්‍ර. කො. දායකත්වය | - | 2,25,64,240 |
| හිඟ විශ්‍රාම වැටුප් දායකත්වය - ජීවන වියදම් දීමනාව මත/වි. ප්‍ර. කො. දායකත්වය | - | 95,10,145 |
| මුළු ආදායම | **2,27,97,25,642** | **1,90,60,04,253** |
| **මෙහෙයුම් වියදම්** | | |
| සේවක වැටුප් හා දීමනා | 1,33,27,97,583 | 1,08,95,75,284 |
| ගමන් වියදම් | 97,08,196 | 1,17,06,312 |
| සැපයීම් | 7,02,06,910 | 6,14,01,364 |
| නඩත්තු සේවා | 8,39,11,225 | 2,45,03,027 |
| කොන්ත්‍රාත් සේවා | 25,28,18,668 | 20,49,76,567 |

| | 2013<br>රු. | 2012 ගැළපූ<br>රු. |
|---|---|---|
| වෙනත් පුනරාවර්තන වියදම් | 18,70,95,588 | 16,24,65,234 |
| නගර සංවර්ධන ව්‍යාපෘතිය | 36,05,597 | - |
| ක්ෂයවීම් | 17,37,13,342 | 27,01,89,981 |
| ශිෂ්‍යාධාර | 3,93,75,200 | 2,19,45,600 |
| මහපොළ ශිෂ්‍යත්ව | 10,59,86,000 | 13,24,38,150 |
| **මුලු වියදම්** | **2,25,92,18,308** | **1,97,92,01,519** |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් මගින් ඌනතාවය/අතිරික්තය** | **2,05,07,333** | **(7,31,97,266)** |

## ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය

2013 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

| | 2013.12.31<br>දිනට<br>රු. | 2012.12.31<br>දිනට ගැළපූ<br>රු. |
|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් වූ මුදල් ප්‍රවාහය** | | |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් තුළින් (ඌනතාවය)/අතිරික්තය | 2,05,07,333 | 7,31,97,266 |
| **ගැළපීම්** | | |
| ක්ෂය කිරීම | 17,37,13,342 | 27,01,89,981 |
| මෝටර් වාහන විකුණුම් මත ලාභය | (20,07,530) | - |
| ආයෝජන පොලී | (3,20,63,545) | (1,57,49,848) |
| විශ්‍රාම පාරිතෝෂික වෙන්කිරීම | 4,49,72,181 | 2,71,14,906 |
| ප්‍රාග්ධන ක්‍රමක්ෂය | (15,01,96,736) | (7,40,25,147) |
| වාහන ප්‍රදාන ක්‍රමක්ෂය | (36,85,000) | (32,35,833) |
| උපයාගත් අරමුදල් තුළින් ප්‍රාග්ධන ප්‍රදාන ක්‍රමක්ෂය - ශාස්ත්‍ර පීඨය | (51,95,738) | (49,05,477) |
| පරිත්‍යාග ක්‍රමක්ෂය | (64,93,705) | (38,61,027) |
| IRQU ව්‍යාපෘති ක්‍රමක්ෂය | (75,45,142) | (11,38,60,189) |
| පෙර වර්ෂයට අදාළ වෙනත් අරමුදල් | - | 13,60,771 |
| වත්කම් කපා හැරීම | 1,748 | 25,780 |
| පුනරාවර්තන ස්වභාවයේ සේවක සංවර්ධන ප්‍රදානය | (15,89,634) | - |
| රජයේ ආධාර - මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම | (9,39,51,402) | (73,00,000) |
| **කාරක ප්‍රාග්ධනයේ වෙනස්වීම්වලට පෙර මෙහෙයුම් ක්‍රියාකාරකම් තුළින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | **(6,35,33,828)** | **25,56,651** |
| ගබඩා තොගය (වැඩිවීම/අඩුවීම) | 15,33,907 | (1,22,44,136) |
| ණයගැතියෝ සහ ලැබිය යුතුදෑ (වැඩිවීම/අඩුවීම) | 21,83,955 | 1,72,80,053 |
| සේවක ණය හා අත්තිකාරම් (වැඩිවීම/අඩුවීම) | (42,33,172) | 22,24,448 |
| අත්තිකාරම් හා පෙර ගෙවීම් (වැඩිවීම/අඩුවීම) | (1,47,13,363) | 24,29,436 |
| මූලධන වෙන්කිරීම (වැඩිවීම/අඩුවීම) | (97,074) | (23,620) |
| උපචිත වියදම් (වැඩිවීම/අඩුවීම) | 3,74,70,854 | 1,91,54,477 |
| ආපසු ගෙවිය යුතු තැන්පත් (වැඩිවීම/අඩුවීම) | (1,99,48,304) | (23,94,223) |
| ගෙවිය යුතු දෑ (වැඩිවීම/අඩුවීම) | 4,53,83,546 | (1,47,54,139) |
| **කාරක ප්‍රාග්ධන වෙනස් වීමෙන් පසු ඇති වූ මෙහෙයුම් ක්‍රියාකාරකම් තුළින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | **(1,59,53,479)** | **1,42,28,947** |
| පාරිතෝෂිත ගෙවීම | (1,65,14,817) | (1,19,89,913) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් තුළින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | (3,24,68,297 | 22,39,034 |

| | 2013.12.31 දිනට රු. | 2012.12.31 දිනට ගැලපු රු. |
|---|---|---|
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් වූ මුදල් ප්‍රවාහය** | | |
| දේපළ, පිරියත සහ උපකරණ මිලට ගැනීම | (31,80,35,536) | (7,98,64,315) |
| මෝටර් රථ මිලට ගැනීම | 20,07,530 | - |
| වෙනත් ආධාර මගින් දේපළ, පිරියත සහ උපකරණ මිලට ගැනීම | - | (10,69,29,552) |
| ආයෝජන පොළී | 1,27,91,328 | 80,89,140 |
| කෙරීගෙන යන වැඩ | (7,38.34,346) | (6,54,79,207) |
| ආයෝජන | (16,47,37,342) | (7,30,82,809) |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | **(54,18,08,366)** | **(31,72,66,743)** |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් වූ මුදල් ප්‍රවාහය** | | |
| මූලධන ආධාර | 45,45,79,000 | 23,40,00,000 |
| තොරතුරු තාක්ෂණ ආධාර (වි. ප්‍ර. කො.) - පුස්තකාලය | - | 10,00,000 |
| වෙනත් ප්‍රදාන - උසස් අධ්‍යාපන ආයතනය - ත්‍රිත්ව භාෂා වැඩසටහන | - | 17,50,000 |
| කාර්ය මණ්ඩල සංවර්ධන ක්‍රියාකාරකම් | 45,00,000 | - |
| අනුස්මරණ අරමුදල් | 85,27,986 | (76,39,568) |
| විශේෂිත අරමුදල් | 1,38,55,407 | 2,69,91,346 |
| උපයාගත් අරමුදල් දායකත්වය | - | 17,58,733 |
| පර්යේෂණ අරමුදල් | 51,93,473 | 62,68,785 |
| ව්‍යාපෘති පාඨමාලා | 8,61,48,256 | (3,43,65,807) |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | **57,28,04,124** | **22,97,63,490** |
| මුදල් හා මුදල්වලට සමානයන්වලින් සිදුවූ ශුද්ධ වැඩිවීම/(අඩුවීම) | (14,72,539) | (8,52,64,220) |
| කාලපරිච්ඡේදය ආරම්භයේ දී මුදල් හා මුදල්වලට සාමානයන් (සටහන 1) | 2,07,72,250 | 10,60,36,470 |
| **කාලපරිච්ඡේදය අවසානයේ දී මුදල් හා මුදල්වලට සාමානයන් (සටහන 1)** | **1,92,99,710** | **2,07,72,250** |

**සටහන 1**

මුදල් හා මුදල්වලට සමානයන්ගේ සංයුතිය

| | | |
|---|---|---|
| **භාණ්ඩාගාර අරමුදල්** | | |
| මහජන බැංකුව ගංගොඩවිල - ගි/අ 097-1-001-6-2315454 (පුනරාවර්තන ආධාර) | 35,747 | 4,468 |
| මහජන බැංකුව, ගංගොඩවිල - ගි/අ 097-1-001-3-2315455 (මූලධන ආධාර) | 2,51,927 | 8,336 |
| මහජන බැංකුව, ආයතනික ශාඛාව - ගි/අ 004-1-001-0-0210877 | 89,517 | 7,61,824 |
| මහජන බැංකුව, ගංගොඩවිල - ගි/අ 097-1-001-9-2315457 (වෛද්‍ය පීඨය) | 6,09,160 | 18,67,763 |
| **උප එකතුව** | **9,86,351** | **26.42,391** |
| **භාණ්ඩාගාර නොවන අරමුදල්** | | |
| මහජන බැංකුව, ගංගොඩවිල - ගි/අ 097-1-001-8-2315467 (පශ්චාත් උපාධි පීඨය) | 98,489 | 41,80,761 |
| මහජන බැංකුව, ගංගොඩවිල - ගි/අ 097-1-001-6-2315473 (සීඩා සරෙක්) | 13,88,034 | 13,88,034 |
| මහජන බැංකුව, ගංගොඩවිල - ගි/අ 097-1-001-4-2315474 (සීඩා සරෙක්) | 6,01,789 | 6,01,789 |
| මහජන බැංකුව, ගංගොඩවිල - ගි/අ 097-1-001-8-2315472 (ශිෂ්‍ය සහන අරමුදල) | 1,13.198 | 1,21,271 |
| මහජන බැංකුව, ගංගොඩවිල - ගි/අ 097-1-001-1-2315456 (බාහිර විභාග ඒකකය) | 15,72,222 | 23,31,907 |
| මහජන බැංකුව, ගංගොඩවිල - ගි/අ 097-1-001-7-0000629 (50 වන සංවත්සර අරමුදල් ගිණුම) | 91,078 | 1,08,220 |

| | *2013.12.31 දිනට රු.* | *2012.12.31 දිනට ගැලපු රු.* |
|---|---|---|
| මහජන බැංකුව, ගංගොඩවිල - ගි/අ 097-1-001-4-0002229 (කළමනාකරණ පීඨ සංවර්ධන අරමුදල) | 31,49,194 | 53,02,323 |
| මහජන බැංකුව, ගංගොඩවිල - ගි/අ 097-1-001-5-0005005 (ශාස්ත්‍ර පීඨ අරමුදල) | 29,03,204 | 9,63,147 |
| මහජන බැංකුව, ගංගොඩවිල - ගි/අ 097-1-001-4-7709343 (සංවර්ධන අරමුදල) | 33,63,548 | 31,24,416 |
| මහජන බැංකුව, ගංගොඩවිල - ගි/අ 097-1-001-1-0010952 (ඩෙංගු පර්යේෂණ ආයතනය - වෛද්‍ය පීඨය) | 95,166 | - |
| මහජන බැංකුව, ගංගොඩවිල - ගි/අ 097-4-021-8-0010915 (විදේශ ගිණුම - වෛද්‍ය පීඨය - විදේශීය ශිෂ්‍ය ලැබීම්) | 49,34,667 | - |
| **උප එකතුව** | **1,83,10,589** | **1,81,21,869** |
| **සුළු මුදල් අග්‍රිමය** | | |
| පොදු ගිණුම | 2,750 | 7,990 |
| වෛද්‍ය පීඨ ගිණුම | 20 | - |
| **උප එකතුව** | **2,770** | **7,990** |
| මුදල් සංචිතය | - | - |
| **එකතුව** | **19,299,710** | **2,07,72,250** |

2.1 *තත්ත්වාගණනය කළ මතය :* මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බැලපෑම හැර, මූලය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් මස 31 වැනි දිනට ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

ඩබ්ලිව්. පී. සී. වික්‍රමරත්න,
විගණකාධිපති. (වැඩ බලන)

07-1089

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## ප්‍රාදේශීය සංවර්ධන බැංකුව

2008 අංක 41 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනතේ 40 වැනි වගන්තිය මගින් බලාත්මක කරන ලද 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ ප්‍රාදේශීය සංවර්ධන බැංකුව (පෙර සබරගමුව සංවර්ධන බැංකුව) එහි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනාව සම්මත කරගන්නා ලද සම්මුතිය

කොරුවා කන්කානමලාගේ දොන් ඇන්ටන් සුවාරිස්
ගිණුම් අංක : 3300 65200001.

ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ (පෙර සබරගමුව සංවර්ධන බැංකුව) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2010 අප්‍රේල් මස 27 වැනි දින පවත්වන්නට යෙදුන 2010/04 දරන රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී :

"ප්‍රාදේශීය සංවර්ධන බැංකුව (පෙර සබරගමුව සංවර්ධන බැංකුව) වෙනුවෙන් කිරිඇල්ල නීතිඥ හා ප්‍රසිද්ධ නොතාරිස් කුමුදුනී මන්ත්‍රීරත්න විසින් සහතික කරන ලද 2009.03.16 වැනි දින හා අංක 7639 දරන උකස් ඔප්පුව ප්‍රකාර අයවිය යුතු මුදල් ගෙවීම කිරිඇල්ල කුරුගම්මෝදර, ඇන්ටන් ටයර් සර්විස් හි පදිංචි කොරුවා කන්කානමලාගේ දොන් ඇන්ටන් සුවාරිස් යන අය පැහැර හැර ඇති බැවින්, එකී උකස්කරය යටතේ ප්‍රාදේශීය සංවර්ධන බැංකුවට අයවිය යුතු රුපියල් නව ලක්ෂ පනස් පන් දහස් හත්සිය හතලිහයි ශත හැට අටක (රු. 955,740.68) මුදල හා 2010.04.20 වැනි දින සිට වාර්ෂිකව 28% බැගින් වෙන්දේසි දිනය තෙක් රුපියල් අට ලක්ෂ අසූ දෙදහස් තුන්සිය හැට හයයි ශත අනූ හතක (රු. 882,366.97) මුදලක් සඳහා පොළියද, වැට් බදු හා දැන්වීම් ගාස්තු ද ඇතුළු වෙන්දේසි වියදම් ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඒවා අඩුකර අයකර ගැනීම සඳහා කෝට්ටේ, බැද්දගාන පාර, අංක 134හි පදිංචි බලයලත් වෙන්දේසිකරු පී. කේ. සේනාපති මහතා විසින් එකී අංක 7639 දරන උකස්කරය මගින් ප්‍රාදේශීය සංවර්ධන බැංකුවට (පෙර සබරගමුව සංවර්ධන බැංකුව) උකස් කර ඇති මෙහි පහත උපලේඛනයේ විස්තර කරන දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු ය.

### උපලේඛනය

කුමුදුනී මන්ත්‍රීරත්න ප්‍රසිද්ධ නොතාරිස් මහත්මිය විසින් ලියා සහතික කරන ලද අංක 7000 සහ 2006.12.21 දින දරන විකුණුම් ඔප්පුව පිට සහ එකී නොතාරිස් මහත්මිය විසින් ලියා සහතික කරන ලද අංක 7207 සහ 2007.09.17 දින දරන ප්‍රකාශන ඔප්පුව සිට අයිතිව නිරවුල්ව බුක්ති විඳගෙන එන,

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, කුරුවිට කෝරළේ, උතුරු උඩ පත්තුවේ, මාටුවාගල මාටුවාගල ක්ෂේත්‍ර අංක 154 හා 1997.12.29 දින දරන බිම් කැබැල්ලට මායිම් උතුරට : පාර දිගට වෙන්කළ බිමද සහ ලොට් අංක 17 ද, නැගෙනහිරට : පාර දිගට වෙන්කළ බිම සහ මෙම ඉඩමේ ඉතිරි කොටසද, දකුණට : මෙම ඉඩමේ ඉතිරි කොටස සහ ඇලද , බස්නාහිරට : ලොට් අංක 17 සහ ඇලද යන මෙකී මායිම් තුළ පර්චස් දහ අටයි දශම නවයයි බිංදුවක් (අ. 0, රූඩ්. 0, පර්. 18.90) හෙවත් හෙක්ටයාර් 0.0478ක් විශාල ඉඩමට නැවතත් ඩබ්ලිව්. ඒ. ගාමිණී විජේසිංහ බලයලත් මිනින්දෝරු තැන විසින් මැන සාදන ලද අංක 3322 සහ 2007.06.09 දින දරන සැලැස්මේ ප්‍රකාර ලොට් අංක 18 දරන නිශ්චිත බිම් කැබැල්ලට මායිම් උතුරට : පාර දිග වෙන්කළ රක්ෂිතයද සහ ලොට් අංක 17 ද, නැගෙනහිරට : පාර දිගට වෙන්කළ රක්ෂිතය සහ මෙම ඉඩමේ ඉතිරි කොටස ද, දකුණට : මෙම ඉඩමේ ඉතිරි කොටස සහ ඇල ද සහ බස්නාහිරට : ලොට් අංක 17 සහ ඇල යන මෙකී මායිම් තුල පර්චස් දහ අටයි දශම නවයයි බින්දුවක් (අක්. 0, රූඩ්. 0, පර්. 18.90) විශාල ඉඩමට සහ ඊට අයිති ගහකොළ පළතුරු ආදී සියළුම දේත් නින්දම සහ එකී ඉඩමට යාම ඒම සඳහා ඇති සියළුම ප්‍රවේශ මාර්ග භාවිතා කිරීමේ අයිතිවාසිකමද සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණපරිදි,

අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්.

07-1039

---

### ලංකා බැංකුව

**1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ කරනු ලබන දැනුම්දීම**

2014.06.17 වැනි දින පවත්වන ලද රැස්වීමකදී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

ප්‍රසිද්ධ නොතාරිස් ඩී. කිතුල්ගොඩ විසින් සහතික කරන ලද 2011.08.22 දිනැති අංක 2927 දරන උකස් බැඳුම්කරයට අනුව 2014.04.28 දින තෙක් මුල් මුදල හා පොලිය වශයෙන් රු. පනස්පන් ලක්ෂ අසූහය දහස් එකසිය හතලිස් දෙකයි ශත අනූහයක (රුපියල් 5,586,142.96) මුදල සමඟ රු. හතලිස්තුන් ලක්ෂ තිස්තුන් දහස් තුන්සිය විස්සක (රුපියල් 4,333,320.00) මුදල මත වසරකට සියයට දහතුන (13%) බැගින් පොලියක් 2014.04.29 වෙනි දින සිට ගෙවීම් නිම කරන දිනය තෙක් පානදුර, මිනුවන්පිටිය, පැරකුම් මාවතේ, අංක 2C/1 හි දොන් සිරිසෝම ජයතුංග මහතා සහ ජයතුංගගේ දුල්මිනි සෞම්‍යා ජයතුංග මිය යන අයගෙන් අයවිය යුතුව ඇත.

2011.08.22 දිනැති එකී අංක 2927 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු රු. පනස්පන් ලක්ෂ අසූහය දහස් එකසිය හතලිස් දෙකයි ශත අනූහයක (රුපියල් 5,586,142.96) මුදල සමග 2014.04.29 දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට අයවිය යුතු පොලියද, ලංකා බැංකු ආඥා පනතේ 26 වෙනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල්ද අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපල ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොළොන්නාව, විහාර මාවතේ, අංක 50/3 හි පදිංචි වෙන්දේසිකාර ටී. ඇන්ඩ් එච්. ඔක්ෂන්ස් හි වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා හට එකී ලංකා බැංකු ආඥා පනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 19 වන වගන්තිය යටතේද, ලංකා බැංකු ආඥා පනතේ 21 වෙනි වගන්තිය යටතේ මෙම යෝජනාවේ දැන්වීම් පළ කිරීමට ලංකා බැංකුවේ, පානදුර අධිශ්‍රේණි ශාඛාවේ ජ්‍යෙෂ්ඨ කළමණාකරු හට මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

### පළමු උපලේඛනය

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පානදුර ප්‍රාදේශීය සභා සීමාවේ, අංක 679 B දරන වලාන දකුණ ග්‍රාමසේවා නිලධාරි කොට්ඨාසයේ පානදුර තොටමුනේ, පානදුර තල්පිටි දෙබැද්දේ පානදුර මිනුවන්පිටිය පිහිටි, ''උල්දියවලකඩ'' නමැති ඉඩමට එහි ඇති ගොඩනැගිලි, ගහකොළ සහ වෙනත් සියලු දේ සහිතව බලයලත් මිනින්දෝරු ඩී. ජේ. පී. මාගොඩරත්න විසින් සාදන ලද 1947 නොවැම්බර් 09 දිනැති අංක 46 දරන පිඹුරෙහි ලොට් 2 ලෙස දක්වා සීමා නිර්ණය කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 2 උතුරට : අංක 46 දරන පිඹුරෙහි ලොට් A ද නැගෙනහිරට : උල්දියවලකඩ ඕවිටද දකුණට : අංක 477 දරන පිඹුරෙහි ලොට් 1 හා 3 (පාරට වෙන් කළ කොටස) ද බස්නාහිරට : අංක 46 දරන පිඹුරෙහි ලොට් D ද මායිම්ව එකී අංක 46 දරන පිඹුර ප්‍රකාර පර්චස් විසිතුනයි දශම පහක (අ. 0, රූ. 0, පර්. 23.5) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර මෙය පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ F 526/139 හි ලියාපදිංචි කර ඇත.

බලයලත් මිනින්දෝරු ජී. අබේපිටිය විසින් මෑතකදී මැන සාදන ලද 1992 මාර්තු 20 දිනැති අංක 2571 දරන පිඹුරට අනුව එහි ඉඩම පහත ආකාරයට විස්තර කොට ඇත.

එකී මිනුවන්පිටියෙහි පිහිටි ''උල්දියවලකඩ'' නමැති ඉඩමට එහි ඇති ගොඩනැගිලි, ගහකොළ සහ වෙනත් සියලු දේ ඇතුළත් වූ එකී අංක 2571 දරන පිඹුරෙහි ලොට් 2 ලෙස දක්වා සීමා නිර්ණය කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 2 උතුරට : උලදියවලකඩ හෙවත් කහටගහවත්තෙහි ලොට් A ද නැගෙනහිරට : උල්දියවලකඩද, දකුණට : බලයලත් මිනින්දෝරු වයි. කරුණාසේන කොස්තා විසින් සාදන ලද 1986 ජනවාරි 16 දිනැති අංක 447 දරන පිඹුරෙහි නිරූපිත කහටගස්වත්ත හෙවත් උල්දියවලකඩ හි ලොට් 1 සහ 3 ද බස්නාහිරට : කහටගහවත්ත හෙවත් උල්දියකඩවල හි ලොට් D ද මායිම්ව අංක 2571 දරන පිඹුර ප්‍රකාර පර්චස් විසිතුනයි දශම පහක (අ. 0, රූ. 0, පර්. 23.5) බිම් ප්‍රමාණයකින් සමන්විත වේ.

### දෙවන උපලේඛනය

එකී මිනුවන්පිටියෙහි පිහිටි ''උලදියවලකඩ'' නමැති ඉඩමෙහි අංක 46 දරන පිඹුරෙහි ලොට් 46 ලෙස දක්වා සීමා නිර්ණය කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 46 උතුරට : කොස්ගහවත්තද නැගෙනහිරට : අංක 46 දරන පිඹුරෙහි ලොට් A හා c දකුණට : තන්තිරිමුල්ල දක්වා වූ පාරද බස්නාහිරට : අංක 46 දරන පිඹුරෙහි ලොට් B ද මායිම්ව එකී අංක 46 දරන පිඹුර ප්‍රකාර පර්චස් නවයක (අ. 0, රූ. 0, පර්. 9) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර මෙය පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ F 283/17 හි ලියාපදිංචි කර ඇත.-

එකී මිනුවන්පිටියෙහි පිහිටි ''උල්දියවලකඩ'' නැමති ඉඩමෙහි එකී අංක 477 දරන පිඹුරෙහි ලොට් 3 ලෙස දක්වා සීමානිර්ණය කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 3, උතුරට පිඹුර අංක 477 හි ලොට් 2 ද, නැගෙනහිරට පිඹුරු අංක 477 හි ලොට් 1 ද, දකුණට තන්තිරිමුල්ල දක්වා වූ පාරද බස්නාහිරට පිඹුරු අංක 46 හි ලොට් D (පාරට වෙන් කළ කොටස) ද, මායිම්ව එකී අංක 477 දරන පිඹුර ප්‍රකාර පර්චස් එකයි දශම තුනක (අ. 0, රූ.0 , පර්. 1.3) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර මෙය පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ F 283/173 හි ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

එන්. ඩී. එල්. පුෂ්පකුමාර මහතා,
ජ්‍යෙෂ්ඨ කළමනාකරු.

ලංකා බැංකුව,
පානදුර.

07-1078

---

## ලංකා බැංකුව

1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ කරනු ලබන දැනුම්දීම

2015.06.10 වැනි දින පවත්වන ලද රැස්වීමේදී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

1. ප්‍රසිද්ධ නොතාරිස් එස්. ටී. පෙරේරා විසින් සහතික කරන ලද 2012 සැප්තැම්බර් මස 11 දිනැති අංක 632 දරන උකස් බැඳුම්කර අනුව 2015.03.23 දින තෙක් මුල් මුදල හා පොළිය වශයෙන් රුපියල් පනස් අට ලක්ෂ පනස් එක් දහස් නවසිය හැට එකයි ශත විසිපහක (රු.5,851,961.25) මුදල සමග රුපියල් පනස් ලක්ෂයක (රු.5,000,000.00) මුදල මත වසරකට සියයට දහහතරක (14%) බැගින් පොලියක් 2015.03.24 වෙනි දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් හොරණ, කනන්විල, කහටපිටිය සමන්ත එන්ටර්ප්‍රයිසස් (තනි අයිතිකරු කුකුළගේ ජනක පුෂ්පකුමාර නමින්ද ප්‍රසිද්ධ කුකුළගේ දෙන් ජනක පුෂ්පකුමාර මහතා) වෙතින් අයවිය යුතුව ඇත.

2. 2012.09.11 දිනැති එකී අංක 632 දරන එකී උකස් බැඳුම්කර මත අයිරාව මත අයවිය යුතු රුපියල් පනස්අට ලක්ෂ පනස් එක් දහස් නවසිය හැට එකයි ශත විසිපහක (රු.5,851,961.25) මුදල සමග 2015.03.24 දින සිට විකිණීමේ දිනය තෙක ඉහත කී ආකාරයට අයවිය යුතු පොලියද, ලංකා බැංකු ආඥා පනතේ 26 වෙනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල්ද අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොලොන්නාව, විහාර මාවතේ අංක 50/3 හි ටී. ඇන්ඩ් එච්. ඔක්ෂන්ස් හි වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා හට එකී ලංකා බැංකු ආඥා පනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 19 වන වගන්තිය යටතේද, ලංකා බැංකු ආඥා පනතේ 21 වන වගන්තිය යටතේ මෙම යෝජනාවේ දැන්වීම පළකිරීමට ලංකා බැංකුවේ, හොරණ ශාඛාවේ කළමනාකරුහටද මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කලුතර දිස්ත්‍රික්කයේ, හොරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ හොරණ ප්‍රාදේශීය සභා (කනන්විල උප කාර්යාලය) සීමාවේ රයිගම් කෝරළේ, කුඹුකෙ පත්තුවේ, අංක 614C දරන කුඩා උඩුව ග්‍රාමයේ පිහිටි අම්පිටිය නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු කේ. කන්නංගර විසින් සාදන ලද 1996 අප්‍රේල් 02 දිනැති අංක 296A/1996 දරන පිඹුරෙහි ලොට් 2 ලෙස දක්වා සීමා නිර්ණය කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකි ලොට් 2 උතුරට ප්‍රධාන පාරද, නැගෙනහිරට පාර සහ ලොට් 10 සහ 11ද, දකුණට ඩබ්. ඩී. ඒබිස්. සිඤ්ඤෝ, ඩබ්. ඩී. රුවානිස් සිඤ්ඤෝ සහ වෙනත් අයට අයිති දේපළද බස්නාහිරට ලොට් 8 සහ 9 හි 1/4 ක කොටසද මායිම් ව එකී අංක 296A/1996 දරන පිඹුරට අනුව අක්කර එකයි රූඩ් දෙකක (අ. 01, රූ. 2 පර්. 0) බිම් ප්‍රමාණයකින් සමන්විත වන අතර මෙය හොරණ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ C195/37 හි ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

වී. ඩී. ජයලත්,
ජ්‍යෙෂ්ඨ කළමනාකරු.

ලංකා බැංකුව,
හොරණ.

07-1079

---

## හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - බොරලැස්ගමුව ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

සියඹලාපිටියගේ මලිත මංගල ගුණසේකර.

2015 ජූනි මස 25 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන් හා ඒකඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. එම්. ඩී. ඒ. කේ. අධිකාරි විසින් සහතික කරන ලද්දා වූද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි නමට ලියන ලද්දවූ ද 2014 අගෝස්තු මස 25 වැනි දින සහතික කරන ලද අංක 1920 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම සියඹලාපිටියගේ මලිත මංගල ගුණසේකර ණයකරු ලෙස පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් පනස්හයලක්ෂ විසිඑක්දහස් එකසිය විසිතුනයි ශත හැටදෙක (රු. 56,21,123.62)ක මුදලක් 2015 මැයි මස 05 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත අයවිය යුතුව හා ලැබිය යුතුව ඇති හෙයින් ද එකී රු. 56,21,123.62ක මුදල අයකර ගැනීම සඳහා සහ 2015 මැයි මස 06 වැනි දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු හා මුදල් ප්‍රමාණයන් ද තදන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එම මුදල අඩුකොට එකී අංක 1920 දරන බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත උකස්කොට ඇත්තාවූ ද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තාවූ ද දේපළ හා පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකාර පී. මුතුකුමාරණ ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය මෙමගින් යෝජනාව සම්මත කර ගනී.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, උතුරු තුංබෝවිල 576ඒ ග්‍රාම නිලධාරී වසමේ කැස්බෑව නගර සභා සීමාව තුළ තුංබෝවිල හි පිහිටි බට්ටියවත්ත පාරේ වරිපනම් අංක 011/02 දරන බක්මීගහදෙණිය නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩබ්. ඒ. ආර්. එස්. පෙරේරා විසින් 2006 ජූලි මස 19 වැනි දින මැන සාදන ලද අංක 2364ඒ දරන පිඹුරේ ලොට් 1බී4 වශයෙන් දැක්වෙන ඉඩමට මායිම් වශයෙන් උතුරට : ලොට් 1බී3 සහ ද, නැගෙනහිරට : සී. ඩී. ජෝහානිස්ගේ ඉඩමෙන් ද, දකුණට : ලොට් 1බී5 ද සහ බස්නාහිරට : අඩි 12ක් පළල පාරෙන් ද මායිම් වූ එකී අංක 2364ඒ දරන පිඹුර ප්‍රකාරව පර්චස් දහය (අ. 0, රූ. 0, පර්. 10) ක විශාලත්වයෙන් වූ එහි ඇති ගොඩනැගිලි සහ සියලුම දේත් සමඟ වේ.

ඉහත සඳහන් ඉඩම් කොටස බෙදු මැන සාදන ලද පිඹුරක පහත සඳහන් පරිදි විස්තර කොට ඇත.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, උතුරු තුංබෝවිල 576ඒ ග්‍රාම නිලධාරී වසමේ කැස්බෑව නගර සභා සීමාව තුළ තුංබෝවිල හි පිහිටි බක්මීගහදෙණිය නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩබ්. ඒ. ආර්. එස්. පෙරේරා විසින් 2006 ජූලි මස 19 වැනි දින මැන සාදන ලද අංක 2364 දරන පිඹුරේ ලොට් 1බී වශයෙන් දක්වෙන ඉඩමට මායිම් වශයෙන් උතුරට : බට්ටියවත්ත පාර සහ සී. ඩී. ජෝහානිස්ගේ ඉඩමෙන් ද, නැගෙනහිරට : ඉඩම සහ සී. ඩී. ජෝහානිස්ගේ ඉඩමෙන් ද, දකුණට : ලොට් 1සී සහ ලොට් 1ඒ ද සහ බස්නාහිරට : 1ඒ සහ බට්ටියවත්ත පාරෙන් ද මායිම් වූ එකී අංක 2364 දරන පිඹුර ප්‍රකාරව පර්චස් තිස්හයයි දශම තුනයි බිංදුව (අ. 0, රූ. 0, පර්. 36.30) ක විශාලත්වයෙන් වූ එහි ඇති ගොඩනැගිලි සහ සියලුම දේත් සමඟ වන මෙය දෙල්කඳ නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පත්ඉරු සී 306/99 යටතේ ලියාපදිංචි කර ඇත.

කේ. ඒ. එල්. ටී. රණවීර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
මාණ්ඩලික ලේකම්.

07-1134/1

---

**හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - මාවනැල්ල ශාඛාව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

අල්-මුබාරිස් (ප්‍රයිවට්) ලිමිටඩ්.

2015 ජුනි මස 25 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන් හා ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

කල්මුණේ ප්‍රසිද්ධ නොතාරිස් එම්. කේ. පෙරින්පරාජා විසින් සහතික කරන ලද්දා වූද, හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි නමට ලියන ලද්දවූ ද, 2013 අගෝස්තු මස 01 වැනි දින සහතික කරන ලද අංක 1978 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම අල්-මුබාරිස් (ප්‍රයිවට්) ලිමිටඩ් ණයකරු ලෙස පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් එක්කෝටි දහනමලක්ෂ හැටහතරදහස් හත්සිය විසිඅටයි ශත තිස්හයක (රු. 11,964,728.36) මුදලක් 2015 අප්‍රේල් මස 30 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත අයවිය යුතුව හා ලැබිය යුතුව ඇති හෙයින් ද එකී රු. 11,964,728.36ක මුදල අයකර ගැනීම සඳහා සහ 2015 මැයි මස 01 වැනි දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොලිය ද ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු හා මුදල් ප්‍රමාණයන් ද තදන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එම මුදල අඩුකොට එකී අංක 1978 දරන බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත උකස්කොට ඇත්තාවූ ද, මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තාවූ ද, දේපළ හා පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකාර අයි. ඩබ්. ජයසූරිය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය මෙමගින් යෝජනාව සම්මත කර ගනී.

**උපලේඛනය**

නැගෙනහිර පළාතේ, අම්පාර දිස්ත්‍රික්කයේ, පානම්පත්තුවේ පොතුවිල් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පොතුවිල් ප්‍රාදේශීය සභා සීමාව තුළ පී/05 ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුල සින්න උල්ලයි ගමේ පිහිටි (බලයලත් මිනින්දෝරු එස්. ටී. එම්. ෂාහිත් විසින් 2012 ජුනි මස 08 වැනි දින සාදන ලද අංක 2012/325 දරන පිඹුරේ දක්වෙන ලොට් 1හි නැවත මැනීමක් සහ ලොට් 3 නැවත බෙදීමක් වන ඉඩම් කොටස් තුනේ ලොට් 1-3) උල්ලාක් කඩු (ටීපී 277222 කොටසේ) නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. ටී. එම්. ෂාහිත් විසින් 2012 අගෝස්තු මස 01 වැනි දින සාදන ලද අංක 2012/325ඒ දරන පිඹුරේ ලොට් 1 වශයෙන් දැක්වෙන ඉඩමට මායිම් වශයෙන් උතුරට : පාර (පීඑස්) ද, නැගෙනහිරට : කේ. සීකාන්තර් හිමිකම් කියන ඉඩමෙන් ද, දකුණට : අයි. එන්. ඉරද්නරාජා හිමිකම් කියන ඉඩමෙන් ද සහ බස්නාහිරට : දැනට එම්. අයි. එම්. තහීර් හිමිකම් කියන ඉඩමෙන් ද මායිම් වූ පර්චස් විසිතුනයි දශම තුනක් (අ. 0, රූ. 0, පර්. 23.3) හෙවත් හෙක්ටයාර් 0.0590 විශාලත්වයෙන් වූ ඉඩම සමඟ ගොඩනැගිලි සහ එහි පිහිටි අනෙකුත් සියලුම දේත් සමඟ වේ.

ඉහත ඉඩම නැවත මැනීමකට අනුව බලයලත් මිනින්දෝරු එස්. ටී. එම්. ෂාහිත් විසින් 2013 අප්‍රේල් මස 20 වැනි දින සාදන ලද අංක 2013/527 දරන පිඹුරේ ලොට් 1 ලෙස දක්වේ.

කේ. ඒ. එල්. ටී. රණවීර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
මාණ්ඩලික ලේකම්.

07-1134/2

## හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - වාද්දුව ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

මුනිතුංග රණවීර ආරච්චිගේ සුමින්ද.

2015 ජුනි මස 25 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන් හා ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

පානදුර ප්‍රසිද්ධ නොතාරිස් පී. වී. එන්. ඩබ්ලිව්. පෙරේරා විසින් සහතික කරන ලද්දා වූද, හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි නමට ලියන ලද්දවූ ද 2014 අගෝස්තු මස 25 වැනි දින සහතික කළ අංක 4622 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම මුනිතුංග රණවීර ආරච්චිගේ සුමින්ද ණයකරු ලෙස පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් පනස්හයලක්ෂ අසූහතරදහස් පන්සිය දාහතරයි ශත විසිදෙකක (රු. 56,84,514.22)ක මුදලක් 2015 අප්‍රේල් මස 27 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත අයවිය යුතුව හා ලැබිය යුතුව ඇති හෙයින් ද, එකී රු. 56,84,514.22ක මුදල අයකර ගැනීම සඳහා සහ 2015 අප්‍රේල් මස 28 වැනි දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු හා මුදල් ප්‍රමාණයන් ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එම මුදල අඩුකොට එකී අංක 4622 දරන බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත උකස්කොට ඇත්තාවූ ද, මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තාවූ ද දේපළ හා පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකාර, එල්. බී. සේනානායක ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය මෙමගින් යෝජනාව සම්මත කර ගනී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර තොටමුණේ පානදුර තල්පිටි දෙබැද්දේ බණ්ඩාරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ බණ්ඩාරගම ප්‍රාදේශීය සභා සීමාව තුළ තල්පිටි බැද්ද උප කාර්යාලයේ ඉඹුලිහ 694ඒ ග්‍රාම නිලධාරී වසමේ අළුබෝමුල්ල-පමුණුගම හි පිහිටි දෙල්ගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. බී. අබේසිංහ විසින් 2011 ජූලි මස 10 වැනි දින මැන සාදන ලද අංක 2320 දරන පිඹුරේ ලොට් 4 වශයෙන් දක්වෙන ඉඩමට මායිම් වශයෙන් උතුරට : අංක 2320 දරන පිඹුරේ ලොට් 2 සහ 3 ද, නැගෙනහිරට : එම ඉඩමේම ලොට් ජී ද, දකුණට : නිවාසවලට යන ප්‍රධාන පාරෙන් සහ එම ඉඩමේම බලයලත් මිනින්දෝරු එස්. බී. අබේසිංහ විසින් 2010 පෙබරවාරි 17 දින මැන සාදන ලද අංක 1986 දරන පිඹුරේ ලොට් ඒ3 ද සහ බස්නාහිරට : එම ඉඩමේම අංක 1986 දරන පිඹුරේ ලොට් ඒ3 සහ ලොට් ඊ වලින්ද මායිම්වූ එකී අංක 2320 දරන පිඹුර ප්‍රකාරව පර්චස් තිස්හයයි දශම පහයි පහ (අ. 0, රූ. 0, පර්. 36.55) ක විශාලත්වයෙන් වූ එහි ඇති ගොඩනැගිලි සහ සියලුම දේත් සමග වන මෙය පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පත්‍ඉරු ඊ 26/12 යටතේ ලියාපදිංචි කර ඇත.

කේ. ඒ. එල්. ටී. රණවීර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
මාණ්ඩලික ලේකම්.

07-1134/3

## හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - නුගේගොඩ ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

ආරච්චිගේ සුනෙත් මාලිංග ලොකුහේවා.

2015 ජුනි මස 25 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන් හා ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එම්. පී. එම්. මොහොට්ටි විසින් සහතික කරන ලද්දා වූද, හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි නමට ලියන ලද්දවූ ද, 2014 ඔක්තෝබර් මස 15 වැනි දින සහතික කරන ලද අංක 5918 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම ආරච්චිගේ සුනෙත් මාලිංග ලොකුහේවා ණයකරු ලෙස පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් හැටතුන්ලක්ෂ හතලිස්හත්දහස් පන්සිය අනූහතයි ශත හතලිස් එක (රු. 6,347,597.41)ක මුදලක් 2015 මැයි මස 05 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත අයවිය යුතුව හා ලැබිය යුතුව ඇති හෙයින් ද, එකී රු. 6,347,597.41ක මුදල අයකර ගැනීම සඳහා සහ 2015 මැයි මස 06 වැනි දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු හා මුදල් ප්‍රමාණයන් ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එම මුදල අඩුකොට එකී අංක 5918 දරන බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත උකස්කොට ඇත්තාවූ ද, මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තාවූ ද, දේපළ හා පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකාර පී. මුතුකුමාරණ ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය මෙමගින් යෝජනාව සම්මත කර ගනී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, කඩුවෙල මහ නගර සභාව සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සීමාව තුළ කොතලාවල 473 ග්‍රාම නිලධාරී වසමේ කොතලාවල හි පිහිටි 5 වන පටුමගේ ගැමුණුපුර වරිපනම් අංක 34/5 දරන මෙල්ෆට් වත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඒ. ඒ. විජේසූරිය විසින් 1984 මැයි 08 (වඩාත් නිවැරදිව 1989 මැයි 23) වන දින සාදන ලද අංක 2159ඒ දරන පිඹුරෙන් බෙදා වෙන් කළ ලොට් 1බී දරන ඉඩම් කොටසට මායිම් වශයෙන් උතුරට : අංක 2159 දරන පිඹුරේ ලොට් 1ඒ සහ ටී (අඩි 20ක් පළල පාරක් සඳහා වෙන්කරන ලදී) ද, නැගෙනහිරට : අංක 2159 දරන පිඹුරේ ලොට් එච් ද, දකුණට : ලොට් 3ඒ1 ද සහ බස්නාහිරට : අංක 2159 දරන පිඹුරේ ලොට් ජේ වලින් ද මායිම් වූ එකී අංක 2159ඒ දරන පිඹුර ප්‍රකාරව පර්චස් දහය (අ. 0, රූ. 0, පර්. 10) ක විශාලත්වයෙන් වූ ඉඩම සමඟ ගොඩනැගිලි සහ එහි පිහිටි අනෙකුත් සියලු දේත් සමඟ වන මෙය හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පත්ඉරු ඒ 649/42 යටතේ ලියාපදිංචි කර ඇත.

එකී අංක 5918 දරන උකස් බැඳුම්කරයේ දෙවන උපලේඛනයේ වඩාත් සවිස්තරව විස්තර කොට ඇති බලයලත් මිනින්දෝරු කේ. ඩී. ඩබ්. ඩී. පෙරේරා විසින් 2008 පෙබරවාරි 12 වැනි දින සාදන ලද අංක 008032 දරන පිඹුරේ නිරූපිත ලොට් 3 (අඩි 20ක් පළල පාරක් සඳහා වෙන් කරන ලදී) මතින් ප්‍රවේශ අයිතිය ද සමඟ වේ.

කේ. ඒ. එල්. ටී. රණවීර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
මාණ්ඩලික ලේකම්.

07-1134/4

**හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. - නුවරඑළිය ශාඛාව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

වෛතිලිංගම් රාජේන්ද්‍රන්.
රාජේන්ද්‍රන් තුසිනාත් හෙවත් රාජේන්ද්‍රන් දූෂිනාතන්.

2015 ජුනි මස 25 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන් හා ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

මෙහි පහත පළවන උපලේඛනයේ වඩාත් සවිස්තර කර ඇති දේපළ නුවරඑළිය ප්‍රසිද්ධ නොතාරිස් ඒ. පී. කනපතිපිල්ලේ විසින් සහතික කරන ලද්දවූ ද, හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි නමට ලියන ලද්දවූ ද 2013 මැයි මස 29 වැනි දින සහතික කළ අංක 5714 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම් වෛතිලිංගම් රාජේන්ද්‍රන් සහ රාජේන්ද්‍රන් තුසිනාත් හෙවත් රාජේන්ද්‍රන් දූෂිනාතන් ණයකරු වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ 2015 අප්‍රේල් 30 වැනි දිනට හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත රුපියල් එක්කෝටි හතලිස්තුන්ලක්ෂ තුන්දහස් අටසියහැටයි ශත තිස්නමය (රු. 14,303,860.39) ක මුදලක් අයවිය යුතුව හා ලැබිය යුතුව ඇති හෙයින් ද,

මෙහි පහත දෙවන උපලේඛනයේ වඩාත් සවිස්තර කර ඇති දේපළ නුවර ප්‍රසිද්ධ නොතාරිස් එම්. එස්. පෙරේරා විසින් සහතික කරන ලද්ද වූ ද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි නමට ලියන ලද්දවූ ද 2013 ජූලි 11 වැනි දින සහතික කරන ලද අංක 3221 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම වෛතිලිංගම් රාජේන්ද්‍රන් සහ රාජේන්ද්‍රන් තුසිනාත් හෙවත් රාජේන්ද්‍රන් දූෂිනාතන් ණයකරු ලෙස පැහැර හැර හෙයින් එකී බැඳුම්කරය යටතේ 2015 අප්‍රේල් මස 30 වැනි දිනට හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත රුපියල් හැත්තෑහත්ලක්ෂ අනූඅටදහස් හයසිය හැටඅටයි ශත තුන (රු. 7,798,668.03) ක මුදලක් අයවිය යුතුව හා ලැබිය යුතුව ඇති හෙයින් ද,

එකී මුදල්වල එකතුවන (රු. 22,102,528.42) ක මුදල අයකර ගැනීම සඳහා සහ 2015 මැයි මස 01 වැනි දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු හා මුදල් ප්‍රමාණයන් ද තදන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එම මුදල අඩුකොට එකී අංක 5714 සහ 3221 දරන බැඳුම්කරයන් මගින් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත උකස් කොට ඇත්තාවූ ද මෙහි පළවන "සහ දෙවන උපලේඛනවල සවිස්තරව විස්තර කොට ඇත්තාවූ ද දේපළ හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු ඩී. කේලාට් ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය මෙමගින් යෝජනාව සම්මත කර ගනී.

**පළමුවන උපලේඛනය**

මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ඔයපළාත කෝරළේ, නුවරඑළිය මහනගර සභා සීමාව තුළ නුවරඑළිය අංක 535ඩී ග්‍රාම නිලධාරි වසමේ මිලිටරි පාරේ කොට්ඨාස අංක 7හි පිහිටි පාක් පාරේ වරිපනම් අංක 6/1 දරන ක්‍රෙට්න් විල්ලේජ් නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඒ. එන්. අල්විස් විසින් 1991 ජුනි 19 වැනි දින මැන සාදන ලද අංක 1406 පිඹුරෙන් බෙද වෙන් කළ ලොට් 2 දරන ඉඩම් කොටසට මායිම් වශයෙන් උතුරට : ලොට් 3, මිලිටරි පාරේ වරිපනම් අංක 6 දරන පිඹුරේ ලොට් 6 ද, නැගෙනහිරට : ලොට් 1 සහ 6 න් ද, දකුණට : ලොට් 6, 8 සහ 4න් ද සහ බස්නාහිරට : ලොට් 4 සහ 3න් ද මායිම් වූ එකී පිඹුර ප්‍රකාරව හෙක්ටයාර් බිංදුවයි දශම බිංදුවයි පහයි නමයයි අටක (හෙක්ටයාර් 0.0598) ක විශාලත්වයෙන් වූ ගොඩනැගිලි සමඟ එහි පිහිටි අනෙකුත් සියලුම දේත් සමඟ වන මෙය නුවරඑළිය දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්‍රිරුව ඒ 76/226 යටතේ ලියාපදිංචි කර ඇත.

මූලික පිඹුරු අංක එන්යූ 1406හි පාරක් සඳහා වෙන් කොට ඇති සියලු බිම් කොටස් මතින් ගමන් කිරීමේ ප්‍රවේශ අයිතිය ද සමඟ වේ.

මෑතකදී සාදන ලද පිඹුරක මෙම ඉඩම පහත සඳහන් පරිදි විස්තර කෙරේ :

මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ඔයපළාත කෝරළේ නුවරඑළිය මහනගර සභා සීමාව තුළ අංක 535ඩී නුවරඑළිය ග්‍රාම නිලධාරි වසමේ හි පිහිටි මිලිටරි පාරේ වරිපනම් අංක 6/1 දන් හැව්ලොක් ඩ්‍රයිව් හි 9/2 දරන හාවාඑළිය පතන නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එන්. ලියනගේ විසින් 2013 මැයි 14 දින මැන සාදන ලද අංක 998 පිඹුරෙන් බෙද වෙන්කල ලොට් 2 දරන ඉඩම් කොටසට මායිම් වශයෙන් උතුරට : අංක එන්යූ 1406 දරන මූලික පිඹුරේ ලොට් 1 සහ මිලිටරි පාරේ වරිපනම් අංක 6 ද, නැගෙනහිරට : අංක එන්යූ 1406 දරන මූලික පිඹුරේ ලොට් 1 සහ 6න් ද, දකුණට : අංක එන්යූ 1406 දරන මූලික පිඹුරේ ලොට් 4 සහ ලොට් 6, 8 (පාරෙන්ද) සහ බස්නාහිරට : අංක එන්යූ 1406 දරන මූලික පිඹුරේ ලොට් 4 සහ 3න් ද මායිම් වූ එකී පිඹුර ප්‍රකාරව පර්චස් විසිතුනයි දශම හය (අ. 0, රූ. 0, පර්. 23.6) ක විශාලත්වයෙන් වූ ගොඩනැගිලි සමඟ එහි පිහිටි අනෙකුත් සියලුම දේත් සමඟ වේ.

බලයලත් මිනින්දෝරු එන්. ලියනගේ විසින් 2013 මැයි මස 14 වැනි දින මැන සාදන ලද අංක 998 දරන පිඹුරේ ලොට් 1 සඳහා වෙන්කොට ඇති බිම් කොටස මතින් ගමන් කිරීමේ ප්‍රවේශ මාර්ග අයිතිය ද සමඟ වේ.

**දෙවන උපලේඛනය**

මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ඔයපළාත කෝරළේ, ප්‍රාදේශීය සභා සීමාව තුළ අංක 534 කඳපොළ ග්‍රාම නිලධාරි වසමේ හි පිහිටි කඳපොළ ගමෙහි පිහිටි ඉඩමට බලයලත් මිනින්දෝරු ඩී. එල්. ඩී. වයි. විජේවර්ධන විසින් 1986 ජූලි මස 11 වැනි දින මැන සාදන ලද අංක 3082 පිඹුරෙන් බෙද වෙන්කළ ලොට් 2 දරන ඉඩම් කොටසට මායිම් වශයෙන් උතුරට : අංක 112 දරන පිඹුරේ ලොට් 15 ද, නැගෙනහිරට : ලොට් 3 න් ද, දකුණට : පාක් එස්ටේට් පාරෙන් ද සහ බස්නාහිරට : ලොට් 1න් ද මායිම් වූ එකී පිඹුර ප්‍රකාරව පර්චස් තුනයි දශම හතරයි බිංදුව (අ. 0, රූ. 0, පර්. 3.40) ක විශාලත්වයෙන් වූ ගොඩනැගිලි සමඟ එහි පිහිටි අනෙකුත් සියලුම දේත් සමඟ වන මෙය නුවරඑළිය දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්‍රිරුව ඒ 140/268 යටතේ ලියාපදිංචි කර ඇත.

කේ. ඒ. එල්. ටී. රණවීර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
මාණ්ඩලික ලේකම්.

07-1134/5

### මහජන බැංකුව -නගර මධ්‍ය ශාඛාව (176)

1986 අංක 32 දරන පනත මගින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඈ වගන්තිය යටතේ වූ යෝජනා සම්මතය

1986 අංක 32 දරන පනත මගින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඈ වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2014.01.23 දින පවත්වන ලද ස්වකීය අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී පහත සඳහන් යෝජනා සම්මතය ඒකමතිකව සම්මත කරනු ලැබූ බව මෙයින් නිවේදනය කර සිටිනු ලැබේ :

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. දීප්ති ආර් මෙන්ඩිස් මහත්මිය විසින් සහතික කරන ලද 2011.02.10 දින අංක 5230 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, අංක 34/14, එලි හවුස් පාර, කොළඹ 15 යන ස්ථානයේ ස්වකීය ලියාපදිංචි කාර්යාලය පිහිටා ඇති 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යථා පරිදි සංස්ථාගත කරන ලද සමාගමක් වූ සෙන්ට් ඈන්ස් ඩිස්ට්‍රිබියුටර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය විසින් සහ එකී සමාගමේ අධ්‍යක්ෂවරුන් වන ඈන් රුමන්ති විජයකුලසූරිය, ඇන්තනී මාරියස් නිමල් විජේකුලසූරිය යන අය විසින් පැහැරහැර ඇති හෙයින් ද, එකී උකස් බැඳුම්කරය මත දැනට මහජන බැංකුවේ රුපියල් මිලියන හතරයි පන්ලක්ෂ හැත්තෑ හතර දහස් එකසිය අනූවයි ශත තිහක් වූ මුදල් (රු. 4,574,190.30) ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද,

අනතුරුව කිසියම් ගෙවීමක් (සිදුකර ඇත්නම්) එම ගෙවීම අඩු කිරීමෙන් පසුව සහ විකිණීමේ පිරිවැය සහ වෙනත් ගාස්තු ද සමග 2013.08.09 දින සිට වෙන්දේසි දිනය දක්වා රුපියල් මිලියන හතරකුත් තුන්ලක්ෂ පනස් දහසක් (රු. 4,350,000) වූ මුදලක් මත 17.7% (සියයට දහතයි දශතම හතක්) වූ තවදුරටත් වූ පොළිය ද සමග රුපියල් මිලියන හතරයි පන්ලක්ෂ හැත්තෑ හතර දහස් එකසිය අනූවයි ශත තිහක් වූ (රු. 4,574,190.30) මුදලක් අයකර ගැනීම සඳහා ඉහත කී උකස් බැඳුම්කරය මගින් ඉහත කී සමාගම සහ එහි ඉහත කී අධ්‍යක්ෂවරුන් විසින් ඉහත කී බැංකුව වෙත උකස් කරන ලද දේපළ සහ පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකාර ඊ. එස්. රාමනායක මහතා මගින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනත මගින් සංශෝධිත 1981 අංක 29 දරන මහජන බැංකු පනත මගින් තමාවෙත පැවරී ඇති බලතල ප්‍රකාර මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මතකර සිටිනු ලැබේ.

#### උකස් දේපළ පිළිබඳ විස්තරය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහ නගර සභා සීමාව තුළ (ලුණු පොකුණ) නාගරික කොට්ඨාස අංක 5 දරන ස්ථානයේ පිහිටා ඇත්තාවූ ද බලයලත් මිනින්දෝරු එච්. අනිල් පීරිස් විසින් සාදන ලද 2005.02.24 වැනි දින අංක 4973 දරන පිඹුරේ ලොට් අංක "11 A3" ලෙස ලකුණු කර ඇති උතුරට : එලි හවුස් පාර, වරිපනම් අංක "34/14 A" දරන සහ අංක 4260A පිඹුරේ ලොට් අංක "11 a" දරන කොටස සහ ලොට් අංක "11 A 2" දරන කොටස ද, නැගෙනහිරට : ලොට් අංක "11 A 2" සහ එලි හවුස් පාර, වරිපනම් අංක "34/13" දරන පරිශ්‍රය ද, දකුණට : එලි හවුස් පාරේ වරිපනම් අංක "34/13" දරන පරිශ්‍රය සහ ඇන්ඩෘ පෙදෙස ලෝවර් ස්ට්‍රීට් වරිපනම් අංක 68 උද්‍යානය දරන පරිශ්‍රය සහ බටහිරට : එලි හවුස් පාර වරිපනම් අංක "34/14 A" දරන සහ අංක "4260 A" පිඹුරේ ලොට් "11 A" ලෙස නිරූපිත කොටස ද යන මායිම් තුළ පිහිටා ඇති කොළඹ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක A 1059/124 යටතේ ලියාපදිංචි වී ඇති ප්‍රමාණයෙන් පර්චස් හතයි දශම තුනයි හයක් (අ. 0, රූ. 0, පර්. 7.36) හෙවත් (හෙක්ටයාර් 0.018625)ක් වූ බෙද වෙන් කළ ලොට් "11 A 3" ඉඩම් කොටස වේ.

ඉහත කී අංක 4973 දරන පිඹුරේ නිශ්චිතව දක්වා ඇති (ප්‍රවේශ මාර්ගය වන) ලොට් අංක "11 A 3" හරහා සහ ඒ මතින් ගමන් කිරීමේ මාර්ග අයිතිය සහ වෙනත් සියලු පරවශතා අයිතීන් ද ඊට ඇතුළත් වේ.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මීනුවන්ගොඩ ප්‍රාදේශීය සභා සීමාව තුළ අලුත්කුරු කෝරළේ, දසිය පත්තුවේ, දන් සමෘද්ධිගම ගම යනුවෙන් හඳුන්වනු ලබන උරුකලාන පිහිටා ඇති ''කෝන්ගහවත්ත '' හෙවත් දැනට ''කලහගහවත්ත '' යනුවෙන් හඳුන්වනු ලබන ඉඩමේ කොටසක් වශයෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන බලයලත් මිනින්දෝරු එම්. ඩී. එන්. ටී. පෙරේරා විසින් සාදන ලද 2003.09.30 දින අංක 2448 A දරන පිඹුරේ ලොට් "X" ලෙස නිරූපණය කර ඇති ඊසාන දිගට : බලයලත් මිනින්දෝරු එම්. ඩී. එන්. ටී. පෙරේරා විසින් සාදන ලද 2003.09.03 දින අංක 2448 දරන පිඹුරේ ලොට් "A" දරන කොටස ද, ගිණිකොණදිගට : ප්‍රාදේශීය සභා පාර ද, නිරිතදිගට : ප්‍රාදේශීය සභා පාර ද, වයඹදිගට : බලයලත් මිනින්දෝරු කේ. නඩරාජා විසින් සාදන ලද 1995.11.15 දින අංක2351 දරන පිඹුරේ ලොට් "1 A" දරන කොටස ද යන මායිම් තුළ පිහිටි මීගමුව ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ C 994/211 යටතේ ලියාපදිංචි වී ඇති ප්‍රමාණයෙන් පර්චස් විසිදෙකයි දශම අටයි බිංදුවක් (අ. 0, රූ. 0, පර්. 22.80) වූ ලොට් "X" දරන බෙද වෙන් කළ ඉඩම් කොටස සහ ඒ මත වූ ගොඩනැගිලි, ගහකොළ සහ වෙනත් සියලු දේ ද වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

කලාප කළමණාකරු,
(කොළඹ උතුර).

මහජන බැංකුව,
කලාප ප්‍රධාන කාර්යාලය (බස්නාහිර කලාපය - 01),
අංක 11, ආදිපාද වීදිය,
කොළඹ 01.

07-1156

---

### මහජන බැංකුව -කොටහේන ශාඛාව (308)

1986 අංක 32 දරන පනත මගින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඈ වගන්තිය යටතේ වූ යෝජනා සම්මතය

1986 අංක 32 දරන පනත මගින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඈ වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2015.05.28 දින පවත්වන ලද ස්වකීය අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී පහත සඳහන් යෝජනා සම්මතය ඒකමතිකව සම්මත කරනු ලැබූ බව මෙයින් නිවේදනය කර සිටිනු ලැබේ :

මහජන බැංකුව වෙනුවෙන් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. ඩී. ආර්. මෙන්ඩිස් විසින් සහතික කරන ලද 2010.11.29 දින අංක 4977 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, අංක 221/4, නායකකන්ද, හැඳල, වත්තල ලිපිනයේ පදිංචි (1) සින්නයියා රාජගෝපාල්, (2) නිත්‍යප්‍රභා රාජගෝපාල්, (3) වේලායුධම් සුබ්‍රමනියම් යන අය විසින් පැහැරහැර ඇති හෙයින් ද, එකී අංක 4977 දරන උකස් බඳුම්කරය මත දැනට මහජන බැංකුව වෙත රුපියල් මිලියන හයයි හයලක්ෂ හැට අට දහස් අටසිය පනස් නවයයි ශත අසූනවයක් වූ මුදලක් (රු. 6,668,859.89) ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද, අනතුරුව කිසියම් ගෙවීමක් (සිදුකර ඇත්නම්) එම ගෙවීම

අඩුකිරීමෙන් පසුව සහ විකිණීමේ පිරිවැය සහ වෙනත් ගාස්තු ද සමග 2015.01.02 දින සිට වෙන්දේසි දිනය දක්වා වර්ෂයකට 17%ක පොලිය ද සමග රුපියල් පන්ලක්ෂ හැටහතර දහස් හයසිය විසිදෙකයි ශත තිස්හතක් වූ (රු. 5,64,622.37) මුදලක් සහ 2015.01.02 දින සිට වෙන්දේසි දිනය තෙක් වර්ෂයකට 17%ක පොලිය ද සමග රුපියල් මිලියන හතරයි එක්ලක්ෂ හැට දහස් හයසිය දාසයයි ශත හතලිස් අටක් වූ (රු. 4,160,616.48) මුදලක් සහ 2015.01.02 දින සිට වෙන්දේසි දිනය තෙක් වර්ෂයකට 17%ක පොලියක් ද සමග රුපියල් මිලියන එකයි තුන් ලක්ෂ හැත්තෑ පන්දහස් හත්සිය තිස් දෙකයි ශත හැට හතක් වූ (රු 1,375,732.67) මුදලක් අයකර ගැනීම සඳහා ඉහත කී උකස් බැඳුම්කරය මගින් ඉහත කී බැංකුව වෙත උකස් කරන ලද දේපළ සහ පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකාර අර්වින් පෙරේරා මගින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනත මගින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත මගින් තමාවෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මතකර සිටිනු ලැබේ.

### උකස් දේපළ පිළිබඳ විස්තරය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, දකුණු අලුත්කුරු කෝරළේ, රාගම් පත්තුවේ, වත්තල ප්‍රාදේශීය සභාවේ හැඳල උප කාර්යාලය තුළ හැඳල පිහිටා ඇත්තා වූ ද ''කජුගහවත්ත '' යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන ඉඩම සඳහා බලයලත් මිනින්දෝරු හියුග්. ආර්. සමරසිංහ විසින් සාදන ලද 2005 මැයි මස 06 වැනි දින අංක 4348 දරන පිඹුරේ ලොට් අංක 1 ලෙස නිශ්චිතව ලකුණුකර පෙන්නුම් කර ඇති උතුරට : බලයලත් මිනින්දෝරු එස්. ලෝකාන්තන් විසින් සාදන ලද අංක 738 දරන පිඹුරේ "F" දරන බිම් කොටස ද, නැගෙනහිරට : අංක 738 දරන පිඹුරේ ලොට් B4 දරන කොටස ද, දකුණට : අංක 786 දරන පිඹුරේ ලොට් "B8" (මාර්ගය) සහ ලොට් "B2" දරන ඉඩම් කොටස ද, බටහිරට : බලයලත් මිනින්දෝරු එස්. ලෝකාන්තන් විසින් සාදන ලද අංක 738 පිඹුරේ ලොට් "J" සහ ලොට් "I" දරන බිම් කොටස් ද සහ මායිම් තුළ පිහිටි කොළඹ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ B798/53 යටතේ ලියාපදිංචි වී ඇති ප්‍රමාණයෙන් පර්චස් දාසයයි දශම පහයි හතක් (අ. 0, රූ. 0, පර්. 16.57) හෙවත් (හෙක්ටයාර් 0.0419) වූ ලොට් අංක 1 දරන බෙද වෙන් කළ ඉඩම් කොටස සහ ඒ මත වූ ගොඩනැගිලි, ගහකොළ සහ වෙනත් සියලු දේ ද වේ.

ඉහත කී ඉඩම් කොටස පහත දක්වෙන ඉඩමේ මෑතකාලීන මැනීමක් වේ.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, දකුණු අලුත්කුරු කෝරළේ, රාගම් පත්තුවේ, වත්තල ප්‍රාදේශීය සභාවේ හැඳල උප කාර්යාලය තුළ හැඳල ග්‍රාවයේ පිහිටා ඇත්තා වූ ද ''කජුගහවත්ත '' යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන ඉඩම සඳහා බලයලත් මිනින්දෝරු ඩී. ඩී. සී. ඒ. පෙරේරා විසින් සාදන ලද 1996 ජූලි මස 13 වැනි දින අංක 726 දරන පිඹුරේ ලොට් "A" ලෙස ලකුණු කර නිශ්චිතව දක්වා ඇති උතුරට : පී. එම්. ඩබ්. ඩයස් යන අයගේ ඉඩම ද, නැගෙනහිරට : ලොට් ''B4" දරන කොටස ද, දකුණට : ලොට් ''B3" (මාර්ගය) සහ ලොට් ''B2" (වර්තමානයේ පියදාස කලංසූරිය යන අයගේ ඉඩම) දරන කොටස ද, බටහිරට : එන්. ඩබ්. එල්. ජී. ඩයස් යන අයගේ ඉඩම ද යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දාසයයි දශම බිංදුවයි නවයක් වූ (අ. 0, රූ. 0, පර්. 16.09) වූ ලොට් "A" දරන බෙද වෙන් කළ ඉඩම් කොටස සහ ඒ මත වූ ගොඩනැගිලි, ගහකොළ සහ වෙනත් සියදු දේ ද වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

කලාප කළමණාකරු,
(කොළඹ උතුර).

මහජන බැංකුව,
කලාප ප්‍රධාන කාර්යාලය (බස්නාහිර කලාපය - 01),
අංක 11, ආදිපාද වීදිය,
කොළඹ 01.

07-1157

---

### කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී.

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි (ලියාපදිංචි අංකය පී. කිව්. 116) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබූ අභියෝජනාව

ණය ගිණුම් අංකය : 1286267.
පින්නගල මුහන්දිරම්ලාගේ උපුල් නිශාන්ත විජේසිංහ
දෙහිපිටිය විදානේලාගේ තනුජා තුෂාරි දමයන්ති.

2014 ඔක්තෝබර් මස 31 වැනි දින පවත්වන ලද රැස්වීමක දී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විශේෂයෙන් හා ඒකච්ඡන්දයෙන් මෙලෙස නිශ්චය කරනු ලබයි.

රත්නපුර ප්‍රසිද්ධ නොතාරිස් බී. ඩී. අබේවර්ධන විසින් 2012 ජූලි 26 වැනි දින සහතික කරන ලද අංක 5795 දරන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී හි නමට ලියන ලද්දාවූ ද බැඳුම්කරය (මෙහි පළමුවන උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇති ඉඩම සහ යන්ත්‍රෝපකරණ) යටතේ අයවිය යුතු මුදල් ගෙවීම පින්නගල මුහන්දිරම්ලාගේ උපුල් නිශාන්ත විජේසිංහ සහ දෙහිපිටිය විදානේලාගේ තනුජා තුෂාරි දමයන්ති ණයකරුවන් හැටියට පැහැර හැර ඇති හෙයින් ද,

රත්නපුර ප්‍රසිද්ධ නොතාරිස් බී. ඩී. අබේවර්ධන විසින් 2012 ජූලි 26 වැනි දින සහතික කරන ලද අංක 5798 දරන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී හි නමට ලියන ලද්දවූ ද බැඳුම්කරය (මෙහි දෙවන උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇති ඉඩම) යටතේ අයවිය යුතු මුදල් ගෙවීම පින්නගල, මුහන්දිරම්ලාගේ උපුල් නිශාන්ත විජේසිංහ සහ දෙහිපිටිය විදානේලාගේ තනුජා තුෂාරි දමයන්ති ණයකරුවන් හැටියට පැහැර හැර ඇති හෙයින් හෙයින් ද,

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එම්. ඒ. සී. එස්. ජයසූරිය විසින් 2012 ජූලි 26 වැනි දින සහතික කරන ලද අංක 1910 දරන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී හි නමට ලියන ලද්දවූ ද බැඳුම්කරය (මෙහි තුන්වන උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇති ඉඩම) යටතේ අයවිය යුතු මුදල් ගෙවීම පින්නගල මුහන්දිරම්ලාගේ උපුල් නිශාන්ත විජේසිංහ සහ දෙහිපිටිය විදානේලාගේ තනුජා තුෂාරි

දමයන්ති ණයකරුවන් හැටියටත් දෙහිපිටිය විදනේලාගේ තනුජා තුෂාරි දමයන්ති උකස්කරු හැටියටත් පැහැර හැර ඇති හෙයින් ද,

එකී බැඳුම්කරය යටතේ රුපියල් දෙකෝටි තිස්එක්ලක්ෂ විසිනමදහස් පන්සිය පහයි ශත පනස් හත (රු. 23,129,505.57) ක මුදලක් 2014 සැප්තැම්බර් මස 17 වැනි දින වන විට අයවිය යුතුව හා ලැබිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් දෙකෝටි තිස්එක්ලක්ෂ විසිනමදහස් පන්සිය පහයි ශත පනස් හත (රු. 23,129,505.57) ක මුදල අයකර ගැනීම සඳහා සහ 2014 සැප්තැම්බර් 18 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට රු. 18,088,000ක මුදල මත 16.5%ක වැඩිදුර වාර්ෂික පොළිය සහිතව ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු ඇතුලුව මෙතෙක් ලබාගෙන ඇත්තාවූ යම් ගෙවීම් වෙතොත් ඒවාද අඩුකොට එකී අංක 5795, 5798 සහ 1910 දරන බැඳුම්කරයන් යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හට උකස් කොට ඇත්තාවූ ද මෙහි පළවන දෙවන සහ තුන්වන උපලේඛනවල සවිස්තරව විස්තර කොට ඇත්තාවූ ද දේපළ හා පරිශ්‍ර කොළඹ 12, හල්ෆ්ඩෝර්ප් වීදියේ අංක 182හි 3 වන මහලේ ත්‍රිවංක සහ සේනානායක වෙන්දේසිකරුවන් හි අනුඥලත් වෙන්දේසිකරු එල්. බී. සේනානායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය නිශ්චය කරනු ලබයි.

### පළමු උපලේඛනය

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, අටකලන් කෝරළේ, මැද පත්තුවේ, ගොඩකවෙල ප්‍රාදේශීය සභා සීමාවේ ගොඩකවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ උතුරු මාදම්පේ ග්‍රාම නිලධාරි වසමේ මාදම්පේ ගමේ හි පිහිටි ''අම්බලන්ගොඩ වත්ත කොටස '' නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එම්. එම්. ඩී. එස්. ශාන්ත විසින් 2012 ජුනි මස 14 වැනි දින සාදන ලද අංක 5176 දරන පිඹුරේ ඉඩම් කොටසට මායිම් වශයෙන් උතුරට : ගල්ලේනගොඩයාය ද, නැගෙනහිරට : බලයලත් මිනින්දෝරු එල්. යූ. කන්නන්ගර විසින් සාදන ලද අංක 373 දරන පිඹුරේ ලොට් 3 ද, දකුණට : ප්‍රධාන පාර ද සහ බස්නාහිරට : අංක 373 දරන පිඹුරේ ලොට් 1 න් ද මායිම් වූ එකී අංක 5176 දරන පිඹුර ප්‍රකාරව රූඩ් දෙක (අ. 0, රූ. 2, පර්. 0) ක විශාලත්වයෙන් වූ ඉඩම සමඟ ගොඩනැගිලි, ගහකොළ සහ එහි පිහිටි සියලු දේත් සමග වේ.

ඉහත සඳහන් ඉඩම පහත විස්තර සඳහන් ඉඩමේ නැවත මැනීමක් වේ.

ඉහත සඳහන් මාදම්පේ ගමේ හි පිහිටි අම්බලන්ගොඩ වලව් වත්ත හෙවත් අම්බලන්ගොඩ වත්ත නැමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එල්. යූ. කන්නන්ගර විසින් 1974 නොවැම්බර් මස 14 වැනි දින සාදන ලද අංක 373 දරන පිඹුරේ ලොට් 2 වශයෙන් දැක්වෙන ඉඩම් කොටසට මායිම් වශයෙන් උතුරට : ගල්ලේනගොඩයාය ද, නැගෙනහිරට : අංක 373 දරන පිඹුරේ ලොට් 3 වශයෙන් දැක්වෙන එම ඉඩමේම ඉතිරි කොටස ද, දකුණට : රත්නපුර - ඇඹිලිපිටිය ප්‍රධාන පාර ද සහ බස්නාහිරට : අංක 373 දරන පිඹුරේ ලොට් 1 වශයෙන් දැක්වෙන එම ඉඩමේම ඉතිරි කොටසෙන් ද මායිම් වූ එකී අංක 373 දරන පිඹුර ප්‍රකාරව රූඩ් දෙක (අ. 0, රූ. 2, පර්. 0) ක විශාලත්වයෙන් වූ ඉඩම සමඟ ගොඩනැගිලි, ගහකොළ සහ එහි පිහිටි සියලු දේත් සමඟ වන මෙය රත්නපුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්ඉරු F293/242 යටතේ ලියාපදිංචි කර ඇත.

පහත සඳහන් යන්ත්‍රෝපකරණ සහ සවිකිරීම සමඟ වේ.

| | | |
|---|---|---|
| 01. | 45.5" CCCSA ටී රෝලර් | 01 |
| 02. | 47" CCCSA ටී රෝලර් | 01 |
| 03. | 40" CCCSA ටී රෝලර් | 01 |
| 04. | 12"x3 1/2 CCC රෙසිප්‍රොකේටන් රෝල් බ්‍රේකර් | 02 |
| 05. | CCC අඩි 6 වියලනයක් | 01 |
| 06. | PPJ 3T ස්ටොක් ස්ට්‍රැක්ටර් C/W කන්වේයර් | 01 |
| 07. | CCC ඩබල් ටී පැකර් | 01 |
| 08. | ''වෝකර්ස් '' මිච් සිෆ්ටර් | 02 |
| 09. | රෝටරි ටී සිෆ්ටර් | 02 |
| 10. | සක්ෂන් විනෝවර් | 01 |
| 11. | ''බැල්මලෝරියා '' රෝටරි මේඩ් ටී සිෆ්ටර් C/W කන්වේටර් | 01 |
| 12. | මිඩ්ල්ටන් ස්ටෝක් එක්ස්ට්‍රැක්ටර් | 01 |
| 13. | ''ගන්තර් '' 25 ටී බ්ලෝවර් | 01 |
| 14. | කලර් සෙපරේටර් | 01 |
| 15. | ස්කේලර් ඉලෙක්ට්‍රොනික් | 01 |
| 16. | සක්ෂන් විනෝවර් | 01 |
| 17. | ටැරි නිපර් බ්‍රේකර් | 01 |
| 18. | ගිබර් ටී කටර් | 01 |
| 19. | අඩි 4 දර වියලනයක් | 01 |
| 20. | හිමුඩුෆ්ටර් | 02 |

### දෙවන උපලේඛනය

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, අටකලන් කෝරළේ, මැද පත්තුවේ, ගොඩකවෙල ප්‍රාදේශීය සභා සීමාවේ ගොඩකවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ උතුරු මාදම්පේ ග්‍රාම නිලධාරි වසමේ මාදම්පේ ගමේ හි පිහිටි ''අම්බලන්ගොඩ වත්ත '' නැමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එම්. එම්. ඩී. එස්. ශාන්ත විසින් 2008 අප්‍රේල් 12 වැනි දින සාදන ලද අංක 3599 දරන පිඹුරේ ඉඩම් කොටසට මායිම් වශයෙන් උතුරට : ගල්ලෙනගොඩයාය ද, නැගෙනහිරට : බලයලත් මිනින්දෝරු එල්. යූ. කන්නන්ගර විසින් සාදන ලද අංක 373 දරන පිඹුරේ ලොට් 2 ද, දකුණට : ප්‍රධාන පාර ද සහ බස්නාහිරට : ප්‍රධාන පාරෙන් ද මායිම් වූ එකී අංක 3599 දරන පිඹුර ප්‍රකාරව පර්චස් තිහ (අ. 0, රූ. 0, පර්. 30) ක විශාලත්වයෙන් වූ ඉඩම සමඟ ගොඩනැගිලි, ගහකොළ සහ එහි පිහිටි සියළු දේත් සමඟ වේ.

ඉහත සඳහන් ඉඩම පහත විස්තර සඳහන් ඉඩමේ නැවත මැනීමක් වේ.

ඉහත සඳහන් මාදම්පේ ගමේ හි පිහිටි අම්බලන්ගොඩ වලව් වත්ත හෙවත් අම්බලන්ගොඩ වත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එල්. යූ. කන්නන්ගර විසින් 1974 නොවැම්බර් 14 වැනි දින සාදන ලද අංක 373 දරන පිඹුරේ ලොට් 1 වශයෙන් දැක්වෙන ඉඩම් කොටසට මායිම් වශයෙන් උතුරට : ගල්ලෙනගොඩයාය ද, නැගෙනහිරට : අංක 373 දරන පිඹුරේ ලොට් 2 වශයෙන් දැක්වෙන එම ඉඩමේම ඉතිරි කොටස ද දකුණට : සහ බස්නාහිරට : ප්‍රධාන පාරෙන් ද මායිම් වූ එකී අංක 373 දරන පිඹුර ප්‍රකාරව පර්චස් තිස් එක (අ. 0, රූ. 0, පර්. 31)ක විශාලත්වයෙන් වූ ඉඩම සමඟ ගොඩනැගිලි, ගහකොළ සහ එහි පිහිටි සියළු දේත් සමඟ වන මෙය රත්නපුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්ඉරු F 264/89 යටතේ ලියාපදිංචි කර ඇත.

### තුන්වන උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළයේ පල්ලේ පත්තුවේ, කඩුවෙල මහ නගර සභා සීමාව තුළ කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 475A මහදෙණිය ග්‍රාම නිලධාරි වසමේ වැලිවිට ගමේ උළුවහුකරේ පාරේ පිහිටි වරිපනම් අංක 11 දරන පරිශ්‍රයට බටදොඹගහලන්ද නමැති ඉඩම සම්බන්ධයෙන් බලයලත් මිනින්දෝරු පී. සී. ප්‍රනාන්දුපුල්ලේ විසින් 1996 ඔක්තෝබර් මස 09 වැනි දින සාදන ලද අංක 1075 දරන පිඹුරේ ලොට් A (1994 ජුනි 2 වැනි දින සාදන ලද පිඹුරු අංක 151හි ලොට්D (පිඹුරු අංක 104හි දක්වෙන ලොට් 2 හි නැවත බෙදීමක්) බලයලත් මිනින්දෝරු එච්. දේවසුරේන්ද්‍ර විසින් 1994 ජුනි 02 වැනි දින සාදන ලද අංක 151 දරන පිඹුරේ ලොට් Eහි හි කොටසක එකතු කිරීමක්) බෙදා වෙන්කොට බලයලත් මිනින්දෝරු එම්. ඩබ්. තෙපුලන්ගොඩ විසින් 2010

අගෝස්තු 01 වැනි දින සාදන ලද අංක 3643 දරන පිඹුරේ ලොට් A වශයෙන් දක්වෙන ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට : ඩී. ඒ. ඩී. එන්. සිරිවර්ධනගේ ඉඩම අඩි 12ක් පළල පාර සහ එච්. ටී. ගුණරත්නගේ ඉඩම ද, නැගෙනහිරට : කේ. ආර්. එල්. ජයරත්නගේ ඉඩම සහ අඩි 6ක් පළල පාර ද, දකුණට : එච්. ඩී. ආර්. නිල්මිණිට අයිති ඉඩම සහ අඩි 10ක් පළල පාර සහ බස්නාහිරට : යූ. ජී. එන්. රණසිංහ සහ ඩී. ඒ. ඩී. එන්. සිරිවර්ධනට අයිති ඉඩමෙන් ද මායිම් වූ එකී අංක 3643 දරන පිඹුර ප්‍රකාරව පර්චස් විසිහයයි දශම හයයි බිංදුව (අ. 0, රූ. 0, පර්. 26.60) ක විශාලත්වයෙන් වූ ඉඩම සමඟ ගොඩනැගිලි, ගහකොළ සහ එහි පිහිටි සියළු දේත් සමග වන මෙය හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්‍ඉරු ජී 1945/01 යටතේ ලියාපදිංචි කර ඇත.

බලයලත් මිනින්දෝරු එච්. දේවසුරේන්ද්‍ර විසින් 1994 ජුනි 02 වැනි දින සාදන ලද අංක 151 දරන පිඹුරේ ලොට් C වශයෙන් පාරක් සඳහා වෙන්කොට ඇති ඉඩම් කැබැල්ල මතුපිටින් එහා මෙහා යෑමේ අයිතිය සමඟ වේ.

රංජනී ගමගේ,
සමාගම් ලේකම්.

2014 නොවැම්බර් මස 04 වැනි දින.

07-1198

---

## කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී හි (ලියාපදිංචි අංකය පීකිව් 116) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබූ අභියෝජනාව

ණය ගිණුම් අංකය : 329515, 680568 සහ 680564.
රෝයල් බිල්ඩර්ස්.

2014 ජනවාරි මස 03 වැනි දින පවත්වන ලද රැස්වීමක දී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විශේෂයෙන් හා ඒකච්ඡන්දයෙන් මෙලෙස නිශ්චය කරනු ලබයි.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්. එෆ්. ඊ. එස්. ප්‍රනාන්දු විසින් 2005 නොවැම්බර් මස 30 වැනි දින සහතික කරන ලද අංක 3929 සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් බී. ඒ. පී. එස්. බාලසූරිය විසින් 2006 මැයි මස 15 වැනි දින සහතික කරන ලද අංක 77 දරන දැන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී ලෙස හඳුන්වනු ලබන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ්හි නමට ලියන ලද්දා වූ ද බැඳුම්කර (මෙහි පළමුවන උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇති ඉඩම) යටතේ අයවිය යුතු මුදල් ගෙවීම මිහිඳුකුලසූරිය කිංස්ලි ලාල් ප්‍රනාන්දු විසින් තනි අයිතිකාර ව්‍යාපාරයක් ලෙස පවත්වාගෙන යනු ලබන රෝයල් බිල්ඩර්ස් ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් ද,

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්. එෆ්. ඊ. එස්. ප්‍රනාන්දු විසින් 2006 නොවැම්බර් මස 07 වැනි දින සහතික කරන ලද අංක 4893 සහ 2007 අප්‍රේල් මස 03 වැනි දින සහතික කරන ලද අංක 5283 සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එස්. එස්. එම්. රණසිංහ විසින් 2008 මාර්තු 11 වැනි දින සහතික කරන ලද අංක 671 දරන බැඳුම්කර මගින් දැනට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී නමින් හඳුන්වනු ලබන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් හි නමට ලියන ලද්දා වූ ද බැඳුම්කරයන් (මෙහි දෙවන උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇති ඉඩම) යටතේ අයවිය යුතු මුදල් ගෙවීම මිහිඳුකුලසූරිය කිංස්ලි ලාල් ප්‍රනාන්දු විසින් තනි අයිතිකාර ව්‍යාපාරයක් ලෙස පවත්වාගෙන යනු ලබන රෝයල් බිල්ඩර්ස් ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් ද,

එකී බැඳුම්කර යටතේ රුපියල් දෙකෝටි අටලක්ෂ හැටපන්දහස් දෙසීය විසිහතරයි ශත පනස් පහක (රු. 2,08,65,224..55) ක මුදලක් 2013 නොවැම්බර් මස 01 වැනි දින සිට අයවිය යුතුව හා ලැබිය යුතුව ඇති හෙයින් ද එකී රුපියල් දෙකෝටි අටලක්ෂ හැටපන්දාහස් දෙසීය විසිහතරයි ශත පනස් පහක (රු. 20,865,224.55) ක මුදල අයකර ගැනීම සඳහා සහ 2013 නොවැම්බර් 02 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට රු. 34,10,143.74ක මුදල මත 20%ක සහ රු. 83,78,045.89 ක මුදල මත 15% වැඩිදුර වාර්ෂික පොළිය සහිතව ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු ඇතුලුව මෙතෙක් ලබාගෙන ඇත්තාවූ යම් ගෙවීම වෙතොත් ඒවාද අඩුකොට එකී අංක 3929, 77, 4893, 5283 සහ 671 දරන බැඳුම්කරයන් යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී හට උකස් කොට ඇත්තා වූ ද මෙහි පළවන සහ දෙවන උපලේඛනවල සවිස්තරව විස්තර කොට ඇත්තා වූ ද දේපළ හා පරිශ්‍ර කොළඹ 12, හල්ෆ්ඩ්‍රොප් වීදයේ අංක 182හි 3 වන මහලේ ත්‍රිවංක සහ සේනානායක වෙන්දේසිකරුවන් හි අනුඥලත් වෙන්දේසිකරු එල්. බී. සේනානායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය නිශ්චය කරනු ලබයි.

### පළමු උපලේඛනය

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, කඩවත් සතර කොට්ඨාසයේ වෙන්නයිකුදිරිප්පු ගමේ පිහිටි පෙරියවිල්ලු තොටම් නමැති යාබද ඉඩම් සඳහා බලයලත් මිනින්දෝරු සී. එස්. වීරවේලු විසින් 1963 මැයි මස 07 වැනි දින සාදන ලද පිඹුරු අංක 592හි ලොට් 4 සහ 5 දරන යාබද ඉඩම් සඳහා මායිම් වශයෙන් උතුරට : අබ්දුල් හමීඩ් ට අයිති ඉතිරි කොටස ද, නැගෙනහිරට : අබ්දුල් හමීඩ් ට අයිති ලොට් 6 ද, දකුණට : පුත්තලම/කුරුණෑගල ප්‍රධාන මාර්ගය ද සහ බස්නාහිරට : වෛත්‍යලිංගම් පොන්නම්මාට අයිති ඉඩමට මායිම්වූ එකී අංක 592 දරන පිඹුර ප්‍රකාරව පර්චස් විසිදෙකයි දශම පහයි බිංදුව (අ. 0, රූ. 0, පර්. 22.50) ක විශාලත්වයෙන් වන මෙය පුත්තලම ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ F114/196 යටතේ ලියාපදිංචි කර ඇත.

ඉහත සඳහන් ඉඩම් කොටස පහත සඳහන් ඉඩම් කොටස ද සම්බන්ධව මෑතකදී නැවත මැනීමකට භාජනය කරන ලදී.

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, පුත්තලම උප දිසාපති කොට්ඨාසයේ කොට්ඨාස අංක 3 හි වෙන්නයිකුදිරිප්පු ගමේ පිහිටි වරිපනම් අංක 213 දරන පෙරියවිල්ලු තොටම් නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ජේ. ඒ. වී. රාජනායගම් විසින් 2004 සැප්තැම්බර් 26 වැනි දින සාදන ලද පිඹුරු අංක 4709හි ලොට් 1 වශයෙන් දක්වෙන ඉඩම් කොටසට මායිම් වශයෙන් උතුරට : උප්පලි සහ වත්සවතී වීරසිංහට අයිති ඉඩම ද, නැගෙනහිරට : 1963 මැයි 07 වැනි දින පිඹුරු අංක 592හි ලොට් 6 දරන වත්සවතී වීරසිංහට අයිති ඉඩම ද, දකුණට : කුරුණෑගල පාර ද සහ බස්නාහිරට : පිඹුරු අංක 592හි ලොට් 3 දරන (උපාලිට අයත්) එකී අංක 4709 දරන පිඹුර ප්‍රකාරව පර්චස් විස්සක් (අ. 0, රූ. 0, පර්. 20) හෙවත් හෙක්ටයාර් 0.0506ක් වේ.

### දෙවන උපලේඛනය

1. වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, පුත්තලම මහනගර සභා සීමාවේ අංක 3 දරන චේනයිකුදිරිප්පු පරිච්චිල්ලු හි පිහිටි නන්දවන වත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ජේ. ඒ. වී. රාජනායගම් විසින් 2004 ඔක්තෝබර් මස 05 වැනි දින සාදන ලද පිඹුරු අංක 4749හි ලොට් A වශයෙන් දක්වෙන ඉඩමට මායිම් වශයෙන් උතුරට : රජරුළම්මා

අසන්කුද්දූස් පටුමග (අඩි 12ක් පළලැති) සහ පිඹුරු අංක 2532හි ලොට් 2 ද, නැගෙනහිරට : එච්. එම්. විහාබ් සහ තවත් අයට අයිති ඉඩම ද, දකුණට : එම්. ඒ. එච්. කාසිම්ට අයිතිය ඉඩම ද සහ බස්නාහිරට : එම්. ඒ. එම්. කාසිම්ට අයිති ඉඩමට පිඹුරු අංක 4749ට අනුව විශාලත්වයෙන් අක්කර එකොළහයි රූඩ් එකයි පර්චස් තිහක් (අ. 11, රූ. 1, පර්. 30) වේ.

2. වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, පුත්තලම මහනගර සභා සීමාවේ අංක 3 දරන වේනයිකුදිරිප්පු පරිච්චිල්ලු හි පිහිටි නන්දවන වත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ජේ. ඒ. වී. රාජනායගම් විසින් 2004 ඔක්තෝබර් මස 05 වැනි දින සාදන ලද පිඹුරු අංක 4749හි ලොට් B වශයෙන් දැක්වෙන ඉඩමට මායිම් වශයෙන් උතුරට : කුරුණෑගල පාර ද, නැගෙනහිරට : පිඹුරු අංක 2532හි ලොට් 2 ද, දකුණට : පිඹුරු අංක 2532හි ලොට් 4 ද සහ බස්නාහිරට : අසන්කුද්දූස් පටුමග මායිම් වූ පිඹුරු අංක 4749ට අනුව විශාල්වයෙන් රූඩ් තුනක් (අ. 0, රූ. 3, පර්. 0) වන මෙය පුත්තලම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ F 119/77 යටතේ ලියාපදිංචි කර ඇත.

ඉහත සඳහන් පිඹුරු අංක 4749හි ලොට් A වශයෙන් දැක්වෙන ඉඩම් කොටස පහත සඳහන් ඉඩම නැවත බෙදීමක් වේ.

ඉහත සඳහන් කොට්ඨාස අංක 3 දරන වේනකුදිරිප්පු පුච්චිවිල්ලු හි පිහිටි නන්දවන වත්ත නැමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එන්. පොන්නදෝරේ විසින් 1982 අගෝස්තු මස 10 වැනි දින සාදන ලද පිඹුරු අංක 2532හි ලොට් 4 වශයෙන් දැක්වෙන ඉඩමට මායිම් වශයෙන් උතුරට : හජාරා උම්මා මොහොමඩ් හියුඩා ජබීර් අජුවාන් ගේ ඉඩම සහ හජාරා උම්මා සහ එච්. එම්. ඒ. හුදාගේ ඉඩම වෙන් කරන ලොට් 1 (අ. 12ක් පළල පාර) ද, නැගෙනහිරට : නවාස් සමූහයට අයිති ඉඩම සහ එච්. එම්. වහාබ් සහ තවත් අයට අයිති ඉඩම ද, දකුණට සහ බස්නාහිරට : එම්. ඒ. එම්. කාසීම්ගේ ඉඩමට මායිම් වූ පිඹුරු අංක 2532ට අනුව විශාලත්වයෙන් අක්කර එකොළහයි රූඩ් එකයි පර්චස් තිහක් (අ. 11, රූ. 1, පර්. 30) වන මෙය පුත්තලම ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ F 75/294 යටතේ ලියාපදිංචි කර ඇත.

පිඹුරු අංක 2532හි දැක්වෙන ලොට් B දරන මාර්ග වෙන් කිරීම් මතුපිටින් හා ඒ දිගේ එහා මෙහා යෑමේ අයිතිය සමග වේ.

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, පුත්තලම මහ නගර සභා සීමාවේ කොට්ඨාස අංක 3 දරන වෙන්කඩරිප්පු පුච්චිවිල්ලුහි පිහිටි නන්දවන වත්ත නමැති යාබද ඉඩම්වලට බලයලත් මිනින්දෝරු එන්. සන්ගරලිංගම් විසින් 1997 අප්‍රේල් මස 05 වැනි දින සාදන ලද පිඹුරු අංක 2605 දරන පිඹුරේ හි ලොට් 1 සහ 2 වශයෙන් දැක්වෙන යාබද ඉඩම් සඳහා මායිම් වශයෙන්, උතුරට : කුරුණෑගල පාර ද, නැගෙනහිරට : නවාස් තොටම් ද, දකුණට : එස්. එම්. මහරූෆ්ගේ ඉඩම සහ නවාස් තොටම් ද සහ බස්නාහිරට : එස්. එච්. හියුදගේ ඉඩමට මායිම් වූ පිඹුරු අංක 2065ට අනුව විශාලත්වයෙන් අක්කර පහළොවයි පර්චස් විසිහයයි (අ. 15, රූ. 0, පර්. 26) හෙවත් හෙක්ටයාර් 6.136ක් වන මෙය පුත්තලම ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ F 128/193 යටතේ ලියාපදිංචි කර ඇත.

ආර්. ආර්. දූනුවිල මිය,
සමාගම් ලේකම්.

07-1199

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.